භක්ති ප්‍රබෝධනය
පවුලේ සඟරාව

භක්ති ප්‍රබෝධනය

එකසිය විසිපස්වසරක් ඉක්මවූ නොනවතින යුග මෙහෙවර

2026 නොවැම්බර් - දෙසැම්බර් | 127 වන කාණ්ඩය - 06 කලාපය | පිටු 32 | DOP/MAGAZINE/03/2026

චනවා යනවා



ශ්‍රී ලංකාවේ පළ වන ඉපැරණි ම සිංහල සඟරාව

ආරම්භය 1899

සුසුම් හෙළා ළතැවි තැවී

පද රචනය : චන්ද්‍ර කීර්ති කුලරත්න
තනුව : අයිවෝ ඩෙනිස්
පුබුදු ගීතාංජලී (ගීතිකා අංක 12)



සුසුම් හෙළා ළතැවි තැවී පැමිණි ජීවිතේ
කතර ගෙවා සතුට සොයා දුවන ජීවිතේ
ඉමක් කොනක් තිර කිසිවක් නොමැති ජීවිතේ
ඉපැදුණෙ ඇයි මිහිපිට අප ලබා ජීවිතේ

දහවල ළඟ අඳුර පැතිර රැයකුත් ඇත්තේ
එනව යනව ඒ වගේ ම දුරකුත් නැත්තේ
ඒ ගමනේ අද මෙතැන යි හෙට කොතැනක දෝ
කවද කොතැන කොයි විලසින් කෙළවර වේ දෝ

පැතුම් පතා පෙරුම් පුරා ආ මඟ ආවේ
හමුවී වෙන්වී දිවි සටනෙහි කඳුළැලි බීවේ
පිපී පරවී බිමට වැටෙන මලක් දැ යි සොයා
බලනු මැනවි දැන් ටිකකට කවුද ඔබ කියා

"යළිත් ආ හැකි නිසා නොවෙ ද ඔහු යන්නේ?
නො ගියොත් යළිත් ආ නො හැකි ය. යාම හොඳ ය.
ගොස් ඊම ද හොඳ ය. ලොවැ ඇත්තේ යාම් ඊම් ය.
නැවිත් යන්න බැරි ය. නොගොස් එන්න බැරි ය."

එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ "මළවුන්ගේ අවුරුදු දා" නවකතාවේ අපට මුණගැසෙන නොරිකෝ සංනමැති තරුණියගේ ඒ සිතිවිලි දාමය මෙවර කලාපයේ අප තේමාවට මනා සේ ගැළපේ යැ යි මට සිතේ. සැබැවින් ම ලොව ඇත්තේ යාම් ඊම් ය. කිසිවක් හෝ කිසිවෙක් ස්ථිර ව හෝ සදාකාලිකව මෙලොව රැඳෙන්නට පැමිණ නොමැත.

චන්ද්‍ර කීර්ති කුලරත්නයන් විසින් රචිත "සුසුම් හෙළා ළතැවි තැවී" ගීතයේ පද පෙළ ද මෙම සංවේදී තේමාව ගැඹුරින් සාකච්ඡාවට බඳුන් කර ඇත.

මව් කුසින් බිහි වන විට ම හඬමින් මෙලොවට පැමිණි බිලිඳා, එතැන් සිට සිය ජීවිතය පුරා ම උත්සාහ කරන්නේ සතුට සොයා ගැනීමට ය. එනමුදු, නො බිඳී පවතින සතුටක් හෝ දුකක් නොමැති බව ඔහු හෝ ඇය වයසින් මුහුකුරා යන අතර වටහා ගනු ඇත. යම් සිදුවීමකින් සතුටු වන අප, ඊළඟ මොහොතේ දී වේදනාබර පුවතක් ඇසූ කෙණෙහි ම දුකට පත්වෙමු. දහවල රැයට හැරී, රැය නැවතත් දවලට හැරෙන්නා සේ, හැඟීම් පවා ස්ථිරව නො රැඳී විගසින් වෙනස් වනවා නො වේ ද?

"දහවල ළඟ අඳුර පැතිර රැයකුත් ඇත්තේ
එනව යනව ඒ වගේ ම දුරකුත් නැත්තේ"

මේ යථාර්ථය, "පැවැත්ම" (Being) පිළිබඳ දාර්ශනික ප්‍රශ්න කිහිපයක් අප හමුවේ ඉතිරි කරන බව රචකයා ඉඟි කරයි: ජීවිතයේ සැබෑ අරුත කුමක් ද? මම කවුද? මම ඉපදුනේ ඇයි?

"පිපී පරවී බිමට වැටෙන මලක් දැ යි සොයා
බලනු මැනවි දැන් ටිකකට කවුද ඔබ කියා"

එපමණක් නොවේ. ජීවිතයේ අවසානය පිළිබඳව ප්‍රශ්න කිහිපයකට ද මෙම මෙනෙහි කිරීම අප රැගෙන යයි: ජීවිතය කෙළවර වන්නේ මරණයෙන් ද? එසේත් නොමැති නම්, එය තවත් ජීවිත පැවැත්මක ඇරඹුමක් පමණ ද?

"ඒ ගමනේ අද මෙතැනයි හෙට කොතැනක දෝ
කවදා කොතැන කොයි විලසින් කෙළවර වේ දෝ"

කිතුනු සම්ප්‍රදාය අනුව, නොවැම්බර් හෙවත් මළවුන්ගේ මාසය, මරණය ගැන ගැඹුරින් මෙනෙහි කරන්නට අප සිත් පොලඹවන අතර, දෙව්දු මනුලොව උපන් සීතල උඳුවප මිනිස් උපතේ මහිමය සහ උදාරත්වය සලකුණු කරයි.

එබැවින්, අයිවෝ ඩෙනිසුන්ගේ අලංකාර තනුවෙන් හැඩවූ මෙම ගීතිකාව ජීවිතය විවරණය කරන කැඩපතක් වැනි යයි මට සිතේ.

ගරු ශානිල් දිනුක ජයවර්ධන
නි. ම. නි. පියතුමා
'මැසනද් යොවුන් පියස'
සා. වින්සෙන්ති නිවාසය, මග්ගොන.



ශක්ති පුබෝධනය

2026 නොවැම්බර් - දෙසැම්බර්

ප්‍රකාශනය
නිර්මල මරිය නිකාය

භාරකරු
අතිගරු ඩිලාන් නිරෝෂන් පෙරේරා නි.ම.නි. පියතුමා
නිර්මල මරිය නිකායික ප්‍රාදේශාධිපති
කොළඹ ප්‍රාදේශිකය

සංස්කාරක
ගරු එමාඩ් දල්පතාදු නි. ම. නි. පියතුමා

සංස්කරණ සහය
රූපස් ප්‍රැන්සිස්
ටී. සුනිල් ප්‍රනාන්දු
ලහිරු දරණකුඹුර

කවර නිර්මාණය
අචල රූපසිංහ

පරිගණක පිටු සැකසුම
ෂෙනුත් තේලිස්

මුද්‍රණය
එස් ඇන්ඩ් එස් ප්‍රින්ටර්ස් මුද්‍රණාලය
කොළඹ 10.

පිටුවෙන් පිටුව.....

2 කවරයේ කථාව
3 හෙළිදරව්ව
5 නිර්මල මරිය නිකායේ නව ප්‍රාදේශාධිපති ... ගරු එමාඩ් දල්පතාදු නි. ම. නි. පියතුමා
7 නිවී ගිය රුවන්පුර මිණිපහන ... ගරු දිලූෂ චාමර පෙරේරා පියතුමා
8 හෙළි ගී අඹරේ පායපු ... ගරු එමාඩ් දල්පතාදු නි. ම. නි. පියතුමා
ජාතියේ යශෝරාවය ... රූපස් ප්‍රැන්සිස්
9 ජීවන නෞකාව - ශෙලින්ඩා සමරසිංහ
10 මරණය කාට ද? ... - කාමන් සකුන්තලා
11 දෙති බර දෙසුම් - පිටිපන මා ජයවීර
12 දෙවිඳු වාසභවනය ස්ථිර වාසස්ථානය යි ... ඇග්නස් චන්ද්‍රකාන්ති ජයමාන්න
13 අලුත් බලාපොරොත්තුව ... - ඉමාන් අබේරත්න
14 කිතුනු අනුගාමිකත්වයේ දිවැසිවර පරිකල්පනය ශිරන්ත පෙරේරා
16 ප්‍රසාද ජනක තෝරා ගැනීම - මංගල ජයවර්ධන
17 අරුත් බර නත්තලක් ... - ප්‍රියන්ති ජසින්තා
18 දිගු ගමනක කෙටි දුර ... ශාන්තලාල් හෙට්ටිආරච්චි
19 උපත සිනාව යි - කැතරින් ගුණවර්ධන
20 ආවා වාගෙම යි ගියේ ... - පස්කල් ජයමාන්න
21 සතුට හා කඳුළ - දිමිත්‍රි යොහාන් ප්‍රනාන්දු
පැතුම - ශිරන්ති ප්‍රනාන්දු
22 **A Mother of Expectations** Nimshi Deman
24 පවුල සරසවියකි - බෙනී ජයමාන්න
මෙන්න තවත් ත්‍යාගයක් ...
25 කාච සිත - චමත් බී. පයාගල
අමිතගේ හද ගැස්ම - සී. අමිත
26 එකුත් පන්සිය වසක් අභිසෙස් ... ඒ. ඒ. තෙනුමි ලෙහන්සා
27 ප්‍රහේලිකා අංක - 94 ගරු චාමික සුදර්ශන නි.ම.නි. පියතුමා
28 ප්‍රහේලිකා අංක 92 පිළිතුරු හා ජයග්‍රහණ
29 අ. පො. ස. (සා. පෙළ) ආදර්ශ ප්‍රශ්න පත්‍රය I ජේ. ඒ. එල්. ශ්‍රීමති සිල්වා මෙනවිය
31 අ. පො. ස. (උ. පෙළ) ක්‍රිස්තියානි ධර්මය ... එස්. හේමාල් පෙරේරා

වසර 1899 සිට අඛණ්ඩව
එළිදක්වන භක්ති ප්‍රබෝධනය
ශ්‍රී ලංකාවේ පළ වන
ඉපැරණි ම සිංහල සඟරාව යි.
භක්ති ප්‍රබෝධනය
නිර්මල මරිය නිකායේ
කොළඹ ප්‍රාදේශිකයේ
භාරකාරත්වය යටතේ
පළ වන ප්‍රකාශනයකි.
(නි.ම.නි.)

Bhakthi Prabodhanaya,
Published continuously
since 1899, is the oldest
Sinhala magazine
in Sri Lanka.
Bhakthi Prabodhanaya,
is owned and published by
the Colombo Province of the
Oblates of Mary Immaculate.
(O.M.I.)



කවරයේ කථාව

"එනවා යනවා, එනවා යනවා, එනවා යනවා". මොකක් ද මේ?... ඇයි මේ?...

වචනාර්ථයෙන් සරල වුව ද මෙය විශ්වීය යථාර්ථයක්. ස්වභාවයක්. බොහෝ පිරිස් මේ ගැන විවිධ අර්ථ දැක්වුව ද, මෙය පසුපස හඹා ගිය ද මෙය අවබෝධ කර ගැනීමට කළ යුත්තේ නම් එය නොවේ. මුලින් කළ යුත්තේ ඒ විශ්වීය යථාර්ථයට මුළුමනින් ම අවනත වීම ය. මිනිසකු ලෙස අපේ ඒ පිවිතුරු මුල් ස්වභාවයට පත් වීම ය. එය අසීරු වුව ද කළ යුත්තේ ද එය ම ය. මේ දිවි පෙවෙත පුහුණු කළ කල්හි අප ඒ යථාර්ථයේ අවබෝධතාවට පත් වනු ඇත. අපට අනන්‍ය වූ ජීවත කැඳවීම පිළිබඳ අවබෝධතාවට පත්වනු ඇත.

අචල රූපසිංහ

භක්ති ප්‍රබෝධනය

දායකත්වය එක් වසරකට - රු. 850.00
(මුද්දර ගාස්තුව ද ඇතුළුව)
දායකත්වය වසර දෙකකට - රු. 1700.00
(මුද්දර ගාස්තුව ද ඇතුළුව)

සියලු ම ලිපි, දායකත්ව මුදල් හා විමසිමි
මේ ලිපිනයට යොමු කරන්න.

සංස්කාරක පියතුමා.
"භක්ති ප්‍රබෝධනය"
265, ඩීන්ස් පාර, මරදාන, කොළඹ 10.
දුරකතන : 0112 698 177
විද්‍යුත් තැපෑල :
bhakthi.prabodhanaya@gmail.com
වෙබ් ලිපිනය : bpomi.org

BHAKTHI PRABODHANAYA

Rs. 850.00 for a year (Including Postage)
Rs. 1700.00 for two years
(Including Postage)

All articles, subscriptions and inquiries
should be sent to this address.

Editor.
"Bhakthi Prabodhanaya"
265, Deans Road, Maradana,
Colombo 10, Sri Lanka
Tel. : 0112 698 177
Email: bhakthi.prabodhanaya@gmail.com
Web Address : bpomi.org

එනවා යනවා

හෙළිදරව්ව



ජීවිතය දෙස මොහොතක් නතර වී බලමු. අපට ඇසෙන්නේ, පෙනෙන්නේ, දැනෙන්නේ 'එනවා යනවා' නොවේ ද? විටෙක සිතෙන්නේ අධිවේගී මාර්ගයක දිශාවන් දෙපැත්තකට ගමන් කරන වාහන සේ ය. පිරිසක් අධිවේගී මාර්ගයට ඇතුළු වන අතර තවත් වාහන ගණනාවක් අධිවේගී මාර්ගයෙන් ඉවතට යයි.

කෙනෙක් අපගේ ජීවිතයට එනවා, කාලයක් අප සමඟ සිටිනවා, සිනා සෙනවා, කථා කරනවා, දුක සැප බෙදා ගන්නවා, ළං වෙනවා, ඈත් වෙනවා, යහළු වෙනවා, තරහ වෙනවා, අගය කරනවා, දොස් කියනවා. පසුව කෙදිනක දී ඔහු හෝ ඇය අපෙන් යනවා. ඔබත් මමත් එනවා. ඔබත් මමත් ආ නිසා ම යනවා. දවසක් එනවා. දවසක් යනවා. උදැසන එනවා, සවස යනවා. වසන්තය එනවා, ගිම්හානය යනවා. වැස්ස එනවා, වැස්ස යනවා. පවුලකට දරුවෙක් එනවා. පසු කාලයක දරුවා හෝ දැරිය තමන්ගේ ගමනක් යනවා. මේ තමයි ජීවිත යථාර්ථය.

අපගේ ජීවිතයට එන මිනිස්සු අනන්ත යි; අප්‍රමාණ යි. අපේ ජීවිත ගමන අපට පමණක් අයිති නොවේ. අපේ ජීවිත ගමනට මඟ පෙන්වන්නට, දිරිමත් කරන්නට, වැටුණ තැනින් නැඟිටුවන්නට, ආදරය කිරීමට, ඇතැම් විට අමාරුවේ දමන්නට, පරීක්ෂා ඇති කරන්නට විවිධ අය පැමිණෙති. අපට යස පාඩම් උගන්වන අය ද එති. සමහරු අප ජීවිතයේ දිගු කලක් රැඳෙති. සමහරු කෙටි කාලයකින් අපෙන් ඉවත්ව යති.

සමහරුන් කළ කී දේ අපගේ මතකයන් තුළ රැඳෙයි. ඔවුන් අපට ලබා දුන් මතක සටහන් අමරණීය ය. එබැවින් අපට හමු වන හැම කෙනකු ම අර්ථයක් ඇතිව හමු වූවා විය හැකි ය. කෙනෙක් අපට ආදරය කරන අයුරු ද, සමාව දෙන සහ ඉවසන අයුරු ද, දරා ගන්නා සහ පලිනොගන්නා හැටි ද අපට උගන්වති. ඇතැම් අවස්ථාවල අපට වේදනාවක් දුන් අය නිසා අප තුළ තිබූ ශක්තිය හඳුනා ගැනීමට උපකාරී වී ඇත. එම නිසා අප ජීවිතයට එන යන හැම කෙනකුගෙන් ම යමක් ඉගෙන ගැනීමට අපට අවස්ථාව ඇත.

ජීවිතයේ අමාරු ම කොටස වන්නේ එන අය නොවෙයි. යන අයයි. අප ආදරය කළ අපට සමීප සම්බන්ධතාවක් ඇති කෙනකු අපට සමුදෙන විට හදවත තුළ හිස් තැනක්, පාළුවක්, හුදෙකලාවක් නිර්මාණය වේ. එවන් කෙනකු මිය යන විට එය දරා ගත නොහැකි වේදනාවකි. ඔහු හෝ ඇයගේ කටහඬ අප සිත් සතන් තුළ දෝංකාර දෙයි. සිනහව කථාබහ හුරුපුරුදු චර්යා සියල්ල මතකයන් වේ. බොහෝ අය කෙනකු තමන් ළඟ සිටිනා විට පුද්ගලයාගේ වටිනාකම හඳුනා නොගනිති. ආදරය කළ යුතු අවස්ථාවේ දී කෝප වෙති. අවලාද කියති. මඟ හරිති. බොරු කරති. පලිගනිති. අමනාප වෙති. "පසුව කථා කරනවා. පසුව බලන්න යනවා. මේ දවස්වල වැඩ තියෙනවා" යයි සිතති. එහෙත් "පසුව" යන්න ජීවිතය සහතික නොකරයි. එබැවින් අප සමඟ ජීවත් වන අයගේ අගය ඔවුන් යනතුරු බලා නොසිට හඳුනා ගනිමු. අගය කරමු. ජීවත්වී සිටින විට නොසලකා හැර මඟ හැර නිදහසට විවිධ කථා කියමින් සිටියත් ඒ අය මිය ගිය දා පටන් අපගේ හදවතට මහත් වේදනාවක්, කලකිරීමක්

ඇති කරවයි. මොනවදෝ මග හැරුණු බව අප මෙලොවින් තුරන් වන තෙක් තමන්ගේ සිත තමන්ට දොස් කියයි.

මිනිසුන් පමණක් නොව කාලයත් "එනවා යනවා". අපට ලැබෙන සෑම කාලයක් ම දෙවියන් වහන්සේගෙන් ලැබෙන තිළිණයකි. කවදාවත් අද, හෙට නො ලැබෙයි. ඊයේ අපට තිබුණි. හෙට අපට ලැබේ ද අපි නො දනිමු. කවදා හෝ මම එයාගෙන් සමාව ඉල්ලමි. දෙවියන් වහන්සේට වෙන දවසක ළං වෙමි. පව්කාර ජීවිතය අනාගතයේ අත්හරිමු. තව ටික කාලයකින් සමාව දෙමු. එහෙත් කාලය අප වෙනුවෙන් නතර නොවේ. ඔරලෝසුවේ කටු අපට පෙනෙන සේ ඉදිරියට ගමන් කරයි. ජීවිත කාලය නිහඬ ව දිය පාරක් සේ අපෙන් ඉවත් ව ගලා යයි.

අප මේ ලෝකයට පැමිණියේ අපගේ ම කැමැත්තකින් නොවේ. දෙවියන් වහන්සේ අපට දුන් ජීවිතයක් නිසාය. මේ ජීවිතය අපට බාර දුන් වගකීමක් ලෙස ජීවත් විය යුතුය. අපි මෙලොවට හිස් අතින් ආවෙමු. හිස් අතින් නැවත යන්නෙමු. ජීවිතයක අර්ථය ඇත්තේ ධනය, බලය, දැනුම, තානාන්තරය මත නොවේ.

කොතරම් පරිත්‍යාගීව ප්‍රේම කළා ද? කෙතරම් යහපත කළා ද? කොතරම් සමාව දුන්නා ද? මනුෂ්‍යත්වයට ගරු කරමින් තමන්ට වඩා අනෙකා උසස් යයි දකිමින් සාධාරණ ව ජීවත් වුණා ද? අන් අය වෙනුවෙන් කොපමණ පරිත්‍යාග වුවා ද? යන ආකල්ප, ප්‍රතිපත්ති, සහ ක්‍රියා තුළ ය.

කට ඇරියොත් බොරු කියන, රඟපාමින් ජීවිත ගත කරන, පලිගන්නා බව නොහඟවමින් පලිගන්නා, තොරතෝංචියක් නැතිව අන් අයගේ වැරදි කථා කරන, දිය යටින් ගින්දර ගෙන යන්න පුළුවන් හිතක් පපුවක් නැති අසංවේදී සහකම්පනයක් නැති මිනිසුන් මේ සමාජය තුළ අපට හමුවේ. දහම තුළ සිටිනා බව පෙන්වමින් දහමේ වටිනාකම් විනාශ කරමින් හැසිරෙන උදවිය මෙලොවට ආවේ කුමකට ද? යන්නේ කොහේට ද? යන්න සුළු වශයෙන් හෝ අවබෝධ කර ගැනීමට බැරි වීම ඔවුන්ගේ ජීවිතයේ බේදාන්තය යි.

නත්තල් එනවා යනවා පවසන විට අපට මතක් වන්නේ මනුෂ්‍යයකු ලෙස මෙලොවට පැමිණි ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ ය. දෙවියන් වහන්සේගේ ප්‍රේමය ලොවට ප්‍රත්‍යක්ෂ කරන්නට දුක් විඳින, අසරණ, රෝගී, පව්කරුවන් ආදි ජනතාවට සැනසීම, සුවය, සමාව දීම, උන්වහන්සේගේ දූත මෙහෙවරේ කැපී පෙනුණ ලක්ෂණයන් ය. තම ජීවිතය මිනිස් සංහතිය සඳහා පූජා කළ සේක. ක්‍රිස්තුන් වහන්සේ මෙලොවින් සමු ගත්ත ද උන්වහන්සේගේ අනුගාමිකයෝ ජීවිත පරදුවට තබා ක්‍රිස්තුන් වහන්සේගේ වචනයට සහ ක්‍රියාවන්ට සාක්ෂි දැරූහ. සමහරු ප්‍රාණපරිත්‍යාගී වූහ. මේ තුළ අපට වැදගත් පාඩමක් ගෙන එයි. මිනිසකු යන විට ඔහුගේ හෝ ඇයගේ පැවැත්ම අවසන් විය යුතු නැත. ඒ අය කළ යහපත, ප්‍රතිපත්ති, වටිනාකම් තව දුරටත් ඉදිරියට ගමන් කරයි. කෙනකු මෙලොවින් සමුගන්නා විට මිනිසුන් මතක තබා ගන්නේ පුද්ගලයා සතු වූ භෞතික දෑ නොව ඔහු දායාද කළ මනුෂ්‍ය සහ දහම් වටිනාකම් ය. "**යහපත් මිනිසා තම සිතෙහි නිදන් කළ යහපත් දෙයින් යහපත් දෙය ද, අයහපත් මිනිසා අයහපත් දෙයින් අයහපත් දෙය ද උපදවයි**"(ලූක් 6 : 45).

මෙලොවට අප ආවේ යන්නට මිස ඉන්නට නොවේ. ශූ. ජුසේවාස් මුනිතුමන් පවසන්නේ "**ජීවත් වූ කාලයේ දී නො කළ කිසිවක් මරණ මංචකයේ දී කළ නොහැකි ය**" යන්න ය.

"ඔබත් මමත් හිඳිනා මේ ලොව තුළ කඳුළ සුසුම කුමකට දෝ

ඔබත් මමත් අප දෙදෙනකු ලෙස නොව එකෙකු ලෙසින් සිතමු

හෙටින් උදාවන ලෝකය සැමට ම සුවදායක කරමු"


("ඔබත් මමත් හිඳිනා" යන ගීතයෙන් උපුටා ගත් ඉහත ගී පද කොටස රචනා කර ඇත්තේ දේශාංජලී වික්‍රමසිංහ, තනුව සහ ගායනය විශාරද ජගත් වික්‍රමසිංහයන් ය.)

සංස්කාරක පියතුමා

නිර්මල මරිය නිකායේ කොළඹ ප්‍රාදේශිකයේ නව ප්‍රාදේශාධිපති පියතුමා සහ ප්‍රාදේශාධිපති ධුරයෙන් සමුගත් පියතුමා



අතිගරු අයි. ඩිලාන් නිරෝෂන් පෙරේරා පියතුමා නි.ම.නි. පියතුමා



ගරු රොෂාන් ජූඩ් ලක්ෂ්මන් සිල්වා නි.ම.නි. පියතුමා

නිර්මල මරිය පැවිදි නිකායේ වසර 3කට හෝ 6කට පසු ප්‍රාදේශාධිපති පියතුමා මාරු වී, නව ප්‍රාදේශාධිපති පියතුමකු සහ එතුමන්ගේ උපදේශන කමිටුවට ද නව සාමාජිකයන් පත්වීම අප පැවිදි පංතියේ පවතින ව්‍යවස්ථාවේ සම්මත ක්‍රමය යි. ඒ අනුව පසුගිය වසර 6ක පමණ කාලයක් ප්‍රාදේශාධිපති ලෙස කටයුතු කළ අතිගරු රොෂාන් සිල්වා නි.ම.නි. පියතුමා ඇතුළු උපදේශන කමිටුව ද පසුගියදා එම නිලතලවලින් සමුගත් අතර නව ප්‍රාදේශාධිපති පියතුමකු සහ එතුමාගේ උපදේශන කමිටුවක් පත්වීම පිළිබඳව අපගේ පාඨකයන් මෙලෙස දැනුවත් කරමු.

සග සුව ලැබූ අයි. ඇල්ප්‍රඩ් විලියම් පෙරේරා මහතා සහ එම්. සෙලින් ඩයස් මහත්මිය ගේ ආදරණීය පුත් අතිගරු අයි. ඩිලාන් නිරෝෂන් පෙරේරා නි.ම.නි. පියතුමා වැඩිමහල් සහෝදරියන් දෙදෙනකුගේ සහ සහෝදරයන් දෙදෙනකුගේ පවුලේ බාලයා ය. ක්‍රි. ව. 1972 නොවැම්බර් 17 වන දින සා. අන්තෝනි මුනිතුමන්ගේ පහස ලබන වැලිවේරිය ග්‍රාමයේ ඩිලාන් දරුවා මෙලොව එළිය දුටුවේ ය. වැලිවේරිය, මද්දුම බණ්ඩාර කනිෂ්ඨ විද්‍යාලයෙන් ප්‍රාථමික අධ්‍යාපනය ලබා ද්විතීයික අධ්‍යාපනය සඳහා 1981 ගම්පහ බණ්ඩාරනායක මහ විද්‍යාලයට ඇතුළත් විය. නිර්මල මරිය නිකායේ පැවිදි පූජක ජීවිත සිහිනය සැබෑ කර ගැනීමේ අරමුණ පෙරදැරි කර ගෙන වර්ෂ 1989 සැප්තැම්බර් මස කොහුවල සාන්ත ජෝසප් කනිටු දෙව්සත්හලට ඩිලාන් සිසුවා ඇතුළු වී තම මූලික අධ්‍යාපනය එහි දී සමාප්ත කළේ ය.

අනතුරුව වර්ෂ 1993 ජනවාරි මස මග්ගොන මැසනද් පූර්ව ආධුනික දෙව්සත්හලට ද, 1994 වසරේ සැප්තැම්බර් මස බණ්ඩාරවෙල දිව්‍ය හෘදයේ ආධුනිකාරාමය වන “සිදුපියනිල” නිවාසයට ඇතුළු වී 1995 සැප්තැම්බර් මස 08 වන දින ගරු ඩිලාන් සහෝදරතුමා නිර්මල මරිය නිකායේ පැවිදි ජීවිතය ආරම්භ කළේ ය.

එම වසරේ ම ඔක්තෝබර් මස පළමුවන දා ශ්‍රී ලංකා අප සවාමිදූගේ ජාතික දෙව්සත්හලට ඇතුළු වූ ගරු ඩිලාන් සහෝදරතුමා, දර්ශනවේදි සහ දේව ධර්ම ශාස්ත්‍රය පිළිබඳ හදාරමින් එම උපාධි ද ලබා ගත් අතර ම අම්පිටිය නිමල මරිය නිකායේ දෙව්සත්හලේ පුරා වසර 6ක පූජක පුහුණුව ද හමාර කළේ ය. අනතුරුව 2000 වර්ෂයේ දී අම්පිටිය නිර්මල මරිය නිකායේ දෙව්සත්හලේ දී අප සහෝදරතුමා නිමල මරිය පැවිදි හවුල තුළ සදාකාලික පැවිදි වේදභාර ලබා ගත්තේ ය.

2001 වසරේ සැප්තැම්බර් පළමුවන දා කොළඹ මරදානේ පාතිමා දෙව්මැඳුරේ දී එවකට බදුලු රදගුරු අති උතුම් වින්ස්ටන් ප්‍රනාන්දු දි.ස.නි. හිමිපාණන්ගේ දෑතින් මෙතුමා පුදැදුරු වරම් ලැබී ය. වෙන්නපුව "නාසරෙත්" හි දේශනාවාදී පැවිදි සංඝයට එකතු වෙමින් තම ප්‍රථම පූජක ධර්මදූත මෙහෙවර අප පියතුමා ආරම්භ කළේ ය. වර්ෂ 2005 දී බදුලු පදවිය තුළ බුත්තල ග්‍රාමයේ විමුක්තිදායකයාණන් වන ක්‍රිස්තුස් වහන්සේ ගේ දෙව්මැඳුරේ මීසම් සේවක පියතුමා ලෙස එතුමන් පත් කෙරෙණි. වර්ෂ 2011 ජනවාරි සිට 2014 පෙබරවාරි දක්වා ශ්‍රී ලංකාවේ ඉපැරණි සිංහල කතෝලික සඟරාව වන "භක්ති ප්‍රබෝධනය" සංස්කාරක වශයෙන් කටයුතු කළේ ය. 2011 වර්ෂයේ දී කොළඹ විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කටයුතු කරමින් සමාජ සන්නිවේදනය පිළිබඳ ඩිප්ලෝමාවක් ලබා ගත්තේ ය.

2014 පෙබරවාරි මාසය තුළ ම ඩිලාන් පෙරේරා පියතුමා මග්ගොන සාන්ත විසෙන්ති නිවාසයේ අධ්‍යක්ෂ සහ කළමනාකාර පියතුමන් ලෙස පත් කෙරුණි. එතුමා කැලණි විශ්වවිද්‍යාලයෙන් සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (MA) 2014 දී ලබා ගත්තේ ය. අනතුරුව කොළඹ මරදාන පාතිමා අප ස්වාමිදූගේ දෙව්මැඳුරේ මීසම් සේවක පියතුමා ලෙස පත්වන්නේ 2017 වසරේ දෙසැම්බර් 03 වන දා ය. කැලණිය විශ්වවිද්‍යාලයෙන් සමාජ විද්‍යාව පිළිබඳ දර්ශනපති උපාධිය (M.Phil) 2024 වර්ෂයේ දී මෙතුමා ලබා ගත්තේ ය.

තවදුරටත් උසස් අධ්‍යාපනය සඳහා රුචිකත්වයක් දැක්වූ ඩිලාන් නිරෝෂන් පියතුමා වර්ෂ 2024 දී සැප්තැම්බර් 30 ඔස්ට්‍රේලියාව බලා පිටත්ව ගියේ ය. එහි දී මෙල්බන්හි පිහිටි ඩීකින් (Deakin) විශ්වවිද්‍යාලයෙන් උපදේශනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (M.Coun) 2026 දී ලබා ගත්තේ ය.

යළි දිවයිනට ඒමට කාලය අනුක්‍රමයෙන් ළං වන විට නිර්මල මරිය නිකායේ රෝමයේ පිහිටි ප්‍රධාන නිවාසයේ වෙසෙන මරිය නිකායික පැවිදි පංතියේ ජාත්‍යන්තර නායකත්වය හොබවන ශ්‍රේෂ්ඨාධිපති තැන්පත් අතිගරු ලුවිස් ඉග්නාසිස් රොයිස් අලොන්සෝ නිර්මල මරිය නිකායික පියතුමා විසින් කොළඹ ප්‍රාදේශිකයේ ඊළඟ ප්‍රාදේශධිපති පියතුමන් ලෙස 2026 සැප්තැම්බර් 01 වන දා ඩිලාන් පෙරේරා පියතුමාව නම් කරන ලදී.

තම අධ්‍යාපන කටයුතු හමාර කර යළි දිවයිනට පැමිණි පසු පසුගිය ඔක්තෝබර් 19 වන සඳුදා නිර්මල මරිය නිකායේ කොළඹ ප්‍රාදේශිකයේ ප්‍රාදේශාධිපති ලෙස අතිගරු අයි. ඩිලාන් නිරෝෂන් පෙරේරා නි.ම.නි. පියතුමා පදවි ප්‍රාප්ත විය.

"භක්ති ප්‍රබෝධනය" සඟරාව අතීත ආවර්ජනයට ලක් කරන විට අප මතකයට නැඟෙන්නේ වර්ෂ 2011 සිට 2014 දක්වා මෙතුමා අප සඟරාවේ සංස්කාරක පියතුමා ලෙස කළ මෙහෙවර යි. එය බෙහෙවින් අගය කරමු. අතිගරු ඩිලාන් පෙරේරා පියතුමා පූජක ජීවිතයේ රිදී ජුබිලිය සමරන අවස්ථාවක එතුමාගේ කථාවේ දී මේ වදන් මුවින් පිට විය. "මම කුඩා කල පටන් ආශ්‍රය කළ මාගේ හොඳ ම මිතුරකු වූ ස්වර්ගස්ථ වූ වසන්ත පෙරේරා පැ.තු.නි. සහෝදර තුමා කී දෙයක් මට මතක් වෙනවා. අප දෙදෙනා දෙව්සත්හල් 2කට ඇතුළු වුවත් නිවාඩු කාලයේ දී ඔහු ව හමු වූ විට ඔහු දිනක් මට කීවේ ඩිලාන් අප පියතුමන්ලා වෙලා අනිත් පියතුමන්ලා කරනවාට වඩා වෙනස් විධියෙ වැඩක් කරමු." ඩිලාන් පියතුමෙනි, ඔබ විවිධ අවස්ථාවල විවිධාකාර සමාජ සේවාවලට දායක වූ වසන්ත සහෝදර තුමා කී ලෙස ම වෙනස් විධියේ වැඩ කළ නිර්මල මරිය නිකායික පියතුමකු බව ඔබව ඇසුරු කළ අයට රහසක් නොවේ. එවන් අත්දැකීම් අපගේ මතක සටහන් අතර ගිලිහී නොය යි. ඒවා තුළ සමිඳුන් ඔබව මෙහෙයවනවා යන්න අපි විශ්වාස කරමු. නිර්මල මරිය නිකායේ කොළඹ ප්‍රාදේශිකයේ එඬේරාණන් වන ඔබ තුමන්ට ඔබගේ ප්‍රාර්ථනාවන් මල් ඵල ගැන්වේවා යි භක්ති ප්‍රබෝධනයෙන් ශුභාශිංසන පුද කර සිටිමු!

සේවක නායකත්වයේ ක්‍රිස්තු අනුගාමිකයකු සහ යහපත් එඬේරාණන්ගේ පූර්වාදර්ශය තුළ තම උපදේශන කමිටුවේ සාමාජිකයන් වන ගරු අන්ද්‍රියාස් ප්‍රනාන්දු, ගරු ශානිල් දිනුක ජයවර්ධන, ගරු ජූඩ් සමින්ද්‍ර සපරමාදු, ගරු ඇන්ටන් ග්‍රේෂන් කුමාර සහ ගරු ශාලින්ද ජූඩ් නිර්මල මරිය නිකායික පියතුමන්ලා සමඟ තම යහපත් එඬේරාණන් වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ දූත සේවාව දියත් කරන්නට දේව ආශීර්වාදය සහ දේව ප්‍රඥාව නොබඳව ලබා ගන්නට ආත්මයාණන් වහන්සේ විසින් ඔබ වසා ගනු ලැබේවා යි යයි අපි යාච්ඤා කරමු. ආයු බෝ වේවා!

නිර්මල මරිය නිකායේ කොළඹ ප්‍රාදේශිකයේ ප්‍රාදේශාධිපති ලෙස පසුගිය වසර 6ක් පමණ කැප වී කළ අමිල දූත මෙහෙවරට ගරු රොෂාන් සිල්වා නි.ම.නි. පියතුමාණන්ට භක්ති ප්‍රබෝධනයේ කෘතවේදීත්වය පළ කර සිටිමු. එතුමන්ගේ උපදේශක කමිටුවේ සාමාජිකයන් වන උප ප්‍රාදේශාධිපති ගරු. ජේම්ස් ජයසිංහ ඇතුළු ගරු ජගත් ඇන්තනි, ගරු ක්‍රිෂාන්ත ජයලත්, ගරු ශිවන්ත වාස්, ගරු එමාඩ් දල්පතාදු සහ භාණ්ඩාගාරික ගරු ඇන්ටන් ග්‍රේෂන් කුමාර නිමල මරිය නිකායික පියතුමන්ලාගේ සේවාවට පැවිදි හවුල වෙනුවෙන් තුති පුදමින් වර්තමානයේදී කරන්නාවූ ධර්ම දූත සේවාවන්ට දේව ආශීර්වාදය නොමඳව ලැබේවා යි දෙවි මහෝත්තමයාණන් අභියස යදිමු.

සටහන : **ගරු එමාඩ් දල්පතාදු නි. ම. නි. පියතුමා**

රුවන්පුර හිටපු ගිය මිණිපහනක් වූ විශ්‍රාමික රදගුරු හිමිපාණෝ



රදගුරුතුමකු යනු පූජකවරයේ පූර්ණත්වය යි. ක්‍රිස්තුන් වහන්සේ අනුව යමින් තමන් හට බාර දුන් ජනතාව සාන්ත සභාවේ නීති ප්‍රකාරව සහ ශු. සුවිශේෂයට අනුව ශුද්ධවන්ත මඟෙහි ගෙනයන්නට එතුමෝ වෙහෙස ගත්හ. ක්‍රිස්තු නායකත්වය සැබෑ සේවකත්වයකි. 'Per Crucem Ad Lucem' එනම් **'කුරුසිය මගින් ආලෝකය වෙතට යන්න'** තම ආදර්ශ පාඨය කර ගත් සග සැපත් රුවන්පුර හිටපු රදගුරු අතිඋතුම් ක්ලීටස් චන්ද්‍රසිරි හිමිපාණෝ වචනයේ පරිසමාප්ත අර්ථයෙන් ම කුරුස ගමනට විශ්වාසවන්ත වූ සේවක නායකයෙකි. එසේ ම යැදුම සහ වැඩපල (Ora et Labora) තම ජීවිතය ම කරගත් සිල්වත් තාපස පියතුමෙකි.

සීදුව නිර්දෝෂ මව් සෙවණේ ඉපිද, දවි සමර විදු පියසෙන් සිප් සතර හදාරා සීදුව දේවස්ථානයේ කන්තාරු කණ්ඩායමෙන් දේව කැඳවීමේ බීජය සොයා ගත් සීදුවේ මිණි පහන ද එතුමාණෝ ම වන්නාහ.

තම අවසන් හුස්ම පොද පිටවනතෙක් ම ගමේ පල්ලියෙන් සොයා ගත් දේව කැඳවීම ඉතා ආදරයෙන් සිහිපත් කළ මුල අමතක නො කළ රදගුරු තුමෙකි. තමන් අකුරු කළ පාසලත් බව්තිස්මය ලද පල්ලියත් පළමු දිව්‍ය පූජාව ඔප්පු කළ අල්තාරයත් මියෙනා තුරා අමතක නො කළ එතුමා රෝමයේ අධ්‍යාපනය ලද වසර කිහිපය හැරෙන්නට සෑම අවුරුද්දක ම ගමේ පල්ලියේ මංගල්‍යයට පැමිණියේ මහගෙදරට එන්නට බලා සිටිනා ඇත එපිට රැකියාව කළ දරුවකු ලෙසිනි. උන්වහන්සේගේ මේ විශ්වාසවන්ත ආදරයේ වන්දනා ගමන ගමේ පූජක පැවිදි අපට ශක්තියක් මෙන් ම අභියෝග යක් විය. එසේ ම උන්වහන්සේගේ සිල්වත් ජීවිතය අපගේ පූජක පැවිදි ජීවිතයට ආදර්ශයක් මෙන් ම ආලෝකයක් ද විය. රුවන්පුර වැනි දුෂ්කර ධර්මදූතික පදවියක එඩේරාණන් ලෙස, තම පදවියේ පියතුමන්ලාගේ සිත් නොරිදා, එතුමන්ලාව තේරුම් ගන්නට ද ධෛර්යවත් කරන්නට ද උන්වහන්සේ උත්සාහ කළේ කුරුසියේ ගමන ආදරයෙන් වැලඳගත් එහි අර්ථය හොඳින් දන්නා සැබෑ නායකයෙකු වූ නිසාවෙනි. ඇත්තෙන් ම එතුමා නම් ශුද්ධවන්ත බව සොයා ගිය රදගුරුතුමෙක් ම ය. සරල සිල්වත් පැවිද්දෙක් ම ය. දුක වේදනාව සතුටින් දරාගත් සේවක නායකයෙක් ම ය. කෙටියෙන් කීවොත් කුරුසියේ ආලෝකය සෙවූ ක්‍රිස්තු ශ්‍රාවකයෙක් ම ය.

සටහන : **ගරු දිලූෂ චාමර පෙරේරා පියතුමා**
මීඝම් සහයක, බටගම.

හෙළ ගී අඹරේ පැයූ පුන්සඳක් වූ යතිවරයාණෝ



ගීතයෙන් බණ කියූ රටක් සැනසූ රඹුකන සිද්ධාර්ථ හාමුදුරුවෝ සමාජයේ බොහෝ දෙනෙකුට නො පෙනුණු පැතිකඩ මතු කළෝ ය. “**බුදු බණ කිව්වා නිරන්තරේ අපි තවමත් වනන්තරේ**”. සෙත්, ශාන්තිය, ආදරය, කරුණාව, ගීතයෙන් උන්වහන්සේ බෙදමින් සැදහැවත් ජනතාව දහම් සිසිලසින් අවදි කළ යුගයේ යතිවරයාණන් වහන්සේ රඹුකන සිද්ධාර්ථ හිමියන් බව පැවසීම අතිශයෝක්තියක් නොවන්නේ ය. උන්වහන්සේ ලියූ ගීත හැම එකක් ම පාහේ බොහෝ ජනප්‍රිය ය. ආගම්, ජාති, ලොකු කුඩා භේදයකින් තොරව මේ ගීත හදවත් ස්පර්ශ කර ඇත. ඒ අතර “**බුදු හාමුදුරුවෝ අපිත් දකින් ඇති බණත් අහන්න ඇති**”, “**සියක් ආයු ලැබ**”, “**කාසිවලට ගන්නත් බෑ**”, “**අව්වට වැස්සට හුරු මිනිසුන්නේ**”, “**අපි අසරණ වෙලා වගේ**”, “**බණ කියන රටක්**”, “**හරි හම්බ කරපු දේවල්**”, “**කඳුළු හෙළා නැඹිලියට**”, “**මේ ප්‍රේම කතා නවතා**”, “**ළා දලු බෝපත්**”, “**රෑ සඳ අහස් තලෙන්**” වැනි ගීත ආධ්‍යාත්මික ව, සමාජීය ව සහ මානසික ව සුවපත් කරනවා පමණක් නොව ප්‍රබල පණිවුඩයක් ද සමාජයට ලබා දී ඇත. වෙසක් දිනයට පමණක් නොව නත්තලට ද උන්වහන්සේ ගීත ලියන්නට අමතක නො කළ සේක. දිස්නා අතපත්තු හා දර්ශන වික්‍රමතුංග ගයන,

“නෙත් කඳුළු පිරුණි - දිළිඳුන් පිරි ලෝ දෙරණේ
දුක් කඳුළු තිබුණි - නත්තල් දා බෙත්ලෙහෙමේ”

ගීය ඊට කදිම නිදසුනකි.

මෙරට ගීත සාහිත්‍ය පෝෂණය කරන්නට අමිල මෙහෙවරක් කළ රඹුකන සිද්ධාර්ථ යතිවරයාණෝ යුග පුරුෂයෙකි. උන්වහන්සේගේ බෞද්ධ චින්තනය හරහා මනුෂ්‍යත්වය සහ දැහැමි මග ගීත හරහා ලොව පුරා රාව ප්‍රතිරාව දෙයි. “භක්ති ප්‍රබෝධනය” සඟරාව හරහා අපගේ සියලු පාඨකයන් වෙනුවෙන් උතුම් වූ නිවන උන්වහන්සේට ලැබේවා ! යැයි හද බැතියෙන් ප්‍රාර්ථනා කරමු.

සටහන : ගරු එමාඩ් දල්පතාදු නි. ම. නි. පියතුමා

ජාතියේ යශෝරාවය



“ඔබට ගී ගයන මම කෝකිලාවක නොවෙයි
මග තොටේ ඔබ දකින ගැහැනිය යි”

නොබෝදා දැයෙන් සමුගත්, අපෙන් නික්ම ගිය ආචාර්ය විශාරද නන්දා මාලනි නම් වූ ශ්‍රේෂ්ඨ ගායිකාවගේ සැබෑ ජීවිත පැවැත්මේ පිළිබිඹුවකි. ඇය ගායනා කළ ඉහත ගීත බණ්ඩය. බොහෝ දුක් ගැහැට මධ්‍යයේ කොටහේන ‘කාසි වෙට්ටි’ වත්තෙන් මතුවුණු ‘දේශයේ යශෝරාවය’ ඇය යි. නිරන්තරයෙන් පීඩිත පංතිය නියෝජනය කළ සිරිලක ජාතියේ විමුක්ති හඬේ දෝංකාරය යි. අවසන් ගමන සරලව සිදු කරන්නට තීන්දු කළ යුගයේ අද්විතීය කලාකාරිනිය යි. එතුමිය අපට පරමාදර්ශී ආදරය ජීවත් කරවූ ගැහැනිය යි. ක්‍රිස්තුත්පත්තිය, කුරුසියේ යාගය සහ පාස්කු ඉරුදින ම්ලේච්ඡ ප්‍රහාරය වෙනුවෙන් ඇය ගීත ගායනා කළාය. “**ජේසු ස්වාමිදරුවනේ**”, “**කල්වාරියේ**”, “**දිව්‍ය පූජා යාගයට ආ බැතිමතුන්**” යන ගීත අපගේ හදවත් අදටත් ස්පර්ශ කරයි. තම හඬ පොරුෂයෙන් ගීත ගායනා කරමින් ලක්ෂ සංඛ්‍යාත ජනතාවගේ හදවත තුළ රැඳෙන්නට ඇය සමත් විය. නිර්භයව, විවිධ තාඩන පීඩන මැද පොඩිවෙන තැළෙන බලයට යට කළ ජනතාව මුදා ගන්නට සැබෑ විමුක්ති ගමනකට ජනතාව අවදි කළත් එය බලධාරින් හඳුනා ගත්තේ ඔවුන්ගේ බලයට අභියෝගයක් ලෙස ය. ඇය ගායනා කළේ අයුක්ති සහගතව බලයට යට කරන තරුණ තරුණියන්ගේ, මැණිවරුන්ගේ හඬ ය.

“යදමින් බැඳ විලංගු ලා මගේ පුතා රැගෙන යන්න
ඉඳිකටු ගෙන ඇඟිලි තලා දෙතිස් වධය පමුණුවන්න
අලුත් ලොවක් ගැන සිතීම දඬුවම් දෙන වරද නම්
කුමට එරට අධිකරණය නීතිය සහ විනිසුරන්”

සටහන : රූපස් ප්‍රැන්සිස්

ජීවන නෞකාව

“ගංගාවක් මත දිවෙනවා අප ජීවන නෞකාව
ගල් පරවල හැපෙන්නා සේ බාධක එයි ඉමහත්ව
දිය රැලි නඟන සේ මිහිරි අත්දැකීම් සමුදාව
සියලු දුක සතුට කැටි කොට ගෙන පදවාගෙන
යා යුතු ම ය අප ජීවන නෞකාව”

-ශෙලින්ඩා-

අපගේ ජීවිතය නෞකාවකට සමාන කළ හැකි ය. උපතත් මරණයත් අතර කාල සීමාව අප ජීවිතය ලෙස හඳුන්වන අතර එම ජීවිතය නම් නෞකාව ගමනාන්තය තෙක් පදවාගෙන යාමේ භාරදූර වගකීම පැවරෙනුයේ එම ජීවිතයේ හිමිකරු වන නාවිකයාට ය. එම නාවික ගමන අප සිතන තරම් පහසුවෙන් යා හැකි රෝස මල් යහනාවක් මත යන ගමනක් නොව සුන්දර අත්දැකීම් මෙන් ම ගල්පර සුළි කුණාටු ආදී ඉතා දුෂ්කර අත්දැකීම්වලින් ද සපිරුණු නාවික ගමනකි. ඒ අනුව අපගේ ජීවන නෞකාවට විවිධ මිනිසුන් ගොඩ නැඟෙන අතර එම බොහෝ මිනිස්සු අපට ජීවන පාඩමක් කියා දී හෝ මතකයක් පමණක් ඉතිරි කර නෞකාවෙන් බැස යති. ගමනාන්තය තෙක් අප සමඟ රැඳෙන්නේ අතළොස්සකි.

ජීවන ගැටලු ද එසේ ම ය. ජීවිතයට ප්‍රශ්න ද එන යන බැවින් සුන්දර මෙන් ම දුෂ්කර කාර්තු ද පසු කර ගෙන අපගේ ජීවිතය ඉදිරියට ගෙන යාමට සිදු වේ.

“ඉපදී ලොවේ නවාතැන්පළේ
මිනිසා රඟයි රංගනේ...
භවයෙන් භවේ විරාමේ අපේ
කාලේ ටිකයි ජීවිතේ..
සිනහා....කඳුළු....එනවා...යනවා...”

ඉහත දැක්වෙන හේමසිරි හල්පිට මහතා විසින් පද රචනය කළ, ග්‍රේෂන් ආනන්ද මහතා විසින් ගායනා කරන ලද ‘මමයි රජා’(1989) චිත්‍රපටයේ එන ප්‍රසිද්ධ ගීතය මගින් ද පැවසෙනුයේ ජීවිතය නම් මෙම ඉතා කෙටි නවාතැන්පළේ සිනහව සතුට මෙන් ම කඳුළ දුක ද එන යන බව නොවේ ද?

එම නිසා අපගේ ජීවිතයේ සෑම දෙයක් ම චක්‍රයක් ලෙස සිදුවන බව පැහැදිලිය. **“කිසිවක් සිදු වී අවසාන වන්නේ නැත. සියල්ල ම සිදු වෙමින් පවතී.”** යන ජැක්සන් ඇන්තනි මහතාගේ එක්තරා ප්‍රසිද්ධ ප්‍රකාශයක් මගින් ද ජීවිතයේ මෙම අඛණ්ඩ ගලා යාම මොනවට පැහැදිලි වේ. අප ජීවිතයේ අවසානය ලෙස දකින බොහෝ දෑ සැබැවින් ම නවමු ආරම්භයකට මුල පුරයි. මිනිසකුගේ මරණයක දී පොළොවට යට වන එම අප්‍රාණික මිනිස් සිරුර පවා ජීව විද්‍යාත්මක ලෙස නව ජීවිතයකට පස සකස් කරනවා නොවේ ද? හිමිදිරි උදෑසනක තණපත් අග රැඳුණු කුඩා පිනි බිඳුවක් හිරු පායා ඒමත් සමඟ නිහඬව ම නොපෙනී යන නමුත් එම පිනි බිඳුවට මරණයක් නැත. එය හිරු කිරණත් සමඟ අහස දෙසට වාෂ්ප වී යාම පමණක් සිදු වේ. ඒ අනුව මරණය මඟින් ද යමකු මුළුමනින් ම මැකී යාමක් නොවන අතර ඇසට පෙනෙන භෞතික ශරීරයෙන් මිදී අපගේ හුස්ම ආපසු මෙම විශ්වයට එක් වීමක් පමණක් සිදු වේ.

මෙම ජීවන චක්‍රය අවබෝධ කර ගැනීමට ඍතු භේදය පවතින රටවල ඒ ඒ ඍතුවල පවතින වෙනස්කම් සැලකිල්ලට ගත හැකි ය. සිසිර ඍතුවේදී ගස් වැල්වල කොළ හැලී පරිසරය හිමෙන් වැසී සොබා දහම මිය ගොස් ඇති සෙයක් දක්නට ලැබුණ ද එම ඍතුවේ දී වසන්ත ඍතුවට අලුත් මල් පිපීමට, ඵල දැරීමට අවශ්‍ය පදනම නිහඬව ම සකස් කරනු ලැබේ. ඒ අනුව වසන්තය, ගිම්හානය, සරත් සමය හා සිසිරය යන ඍතු චක්‍රයක් ලෙස සිදුවෙමින් පවතින අතර අවසානයක් දැකිය නොහැකි ය.

ඒ අනුව ස්වභාව ධර්මය යනු ලොව හොඳ ම ගුරුවරයා යන්න පසක් කරමින්, ස්වභාව ධර්මය කියා දෙන මෙම අපූරු පාඩම සිත්හි ධාරණය කර ගනිමින්, දුෂ්කර සීත කාලය වසන්තයට පසුබිම සකස් කරන බව අවබෝධ කර ගෙන, අඳුරු ශීත කාලයේ නොසැලී ජීවිතයට මුහුණ දෙමින් ජීවන ගමනේ දී එන යන, මිනිසුන් හා ප්‍රශ්න ගැටලු තුළින් ජීවිත යථාර්ථය අවබෝධ කර ගෙන ගමනාන්තය තෙක් ජීවන නෞකාව පදවාගෙන යමින් සාර්ථක නාවිකයකු වීමට ස්වභාව ධර්මයේ ම අපූරු නිමැවුමක් වන මිනිසුන් වන අප සැම උත්සාහ කළ යුතු ය.

නීතිවේදී ශෙලින්ඩා සමරසිංහ

මරණය කාටද? කොහෙන්ද?



කිතුනු සභාව මළවුන් සිහිකිරීම සඳහා නොවැම්බර් මාසය නම් කර ඇත. මෙම ක්‍රියාවට යොමු විය යුත්තේ එම මාසය තුළ පමණක් ද? මරණයක් සිදු වන සෑම අවස්ථාවක ම අප ජීවිතයේ කඩඉමක් අපට සිහිගන්වා යි. මැරුණු පසු නොව මරණයට පෙර යම් කෙනකුට හිමි ආත්මයට නිසි ගෞරවයක් දිය යුතු වන්නේ ය.

ජීවතුන් අතර සිටිය දී සාත්තු නො කර මැරණු මොහොතේ මුදල් වැයකර කේටරින් ක්‍රමයට කෑම දෙන විට නම්බුව, පොහොසත්කම එකිනෙකා පරදවන විට තමන්ගේ මමත්වය හිසටත් උඩින් ය. එසේ නම් ඔබත් මමත් අද ලොව තුළ මැරි මැරී ජීවත්වන අය ගැන සිතා බලනවාද? නිතර ම අසන්නට ලැබෙන්නේ ඉතාමත් කනගාටුදායක සිද්ධීන් ය.

අපගේ විශ්වාසයට අනුව ලෝකය මවා අපව පාපයෙන් ගලවා ගන්නේ අප ආදරණීය දෙවියන් වහන්සේගේ ඒකජාතක පුත්‍රයාණන් වූ ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ ය. දේව වචනය තුළ අපට ඔබට පෙන්වා දෙන්නේ මෙලෙස යි. දෙවියන් වහන්සේ ප්‍රේමය යි. අප කෙරෙහි දෙවියන් වහන්සේගේ ප්‍රේමය ප්‍රකාශ කරනු ලැබුවේ දෙවියන් වහන්සේ ස්වකීය ඒකජාතක පුත්‍රයාණන් ලෝකයට එවා වදාළ සේක(1 ජොහන් 4:8-9). පාපකාරී මනුෂ්‍යයා ගිනි ගෙන දැවෙන නිරයකට යැවීමට උන්වහන්සේ නො සිතූ සේක. **“මේ සෙනඟගේ මළකඳන් අහසේ පක්ෂීන්ටත් පොළොවේ මෘගයන්ටත්, ගොදුරු වන්නේ ය. ජෙරුසලමේ වීථිවලිනුත් ප්‍රීති ප්‍රමෝද හඬ ද මනාල මනාලියන්ගේ කටහඬ ද නතර කරන්නෙමි. දේශය පාළුකරයක් වන්නේ ය”** (ජෙරමියා 7 : 33-34) යනුවෙනි. **“ඔබ සග ලොව දක්වා උසස් කරනු ලබන්නෙහි ද? නැත, පාතාලය දක්වා පහත හෙලනු ලබන්නෙහි ය”**(මතෙව් 11:23). **“ඔබ මා පාතාල ලෝකයේ වසා දමා ඔබේ උදහස පහවන තුරු ය”**(ජෝබ් 14:31). **“මා සිටින තැන ඔබ ද සිටින පිණිස ඔබ කැඳවා ගෙන යාමට මම එමි”**(ජොහන් 14: 2-3). යන ක්‍රිස්තුන් වහන්සේගේ වචන අපි විශ්වාස කරමු.

රටේ පවතින ආර්ථික අර්බුදය නිසා ජනතාවගෙන් වැඩි පිරිසක්, බෙහෙත්, අධ්‍යාපනය, ආහාර, රැකියාව වැනි නොයෙකුත් ප්‍රශ්නවලට ගොදුරු වෙමින් දිවි ගෙවයි. මේ ජීවත් වන කාලය තුළ අනිත් අය ගැනත් සංවේදී විය යුතු ය. මිනිස් මරණය තුළින් දෙවිදාණෝ උන්වහන්සේ කැඳවන සේක. කිතුනුවාට මරණය, ජීවිතයේ අවසානය නොව නව ජීවිතයකට ඇතුළත් වීමකි. **“පුනර්ජීවනය ද, ජීවනය ද මම වෙමි, මා අදහා ගන්නා මැරුණත් ජීවත් වන්නේ ය. ජීවත් ව සිටින මා අදහන කිසිවෙක් කිසි කලෙක නො මැරෙන්නේ ය”**. මරණය යනු ජීවිතයේ අවසානය යි. කාලය ගෙවෙත් ම විපත වන මරණයට පත් වන්නෙමු. අනතුරු අසනීප තත්ත්වයන් යටතේ ද මෙලොව ජීවිතය අවසන් වන අවස්ථාවන් ඇත. එසේ නම් තම දහම නිසි ලෙස අදහා ගනිමින් මරණින් මතු සදාතනික ජීවිතය උරුම කර ගැනීමට යහපත් ලෙස අප ජීවත් විය යුතු ය.

මළවුන් වෙනුවෙන් වෙන්කර ඇති මාසයට පමණක් නොව දිනපතා මළවුන් වෙනුවෙන් යදිමින් දයාවේ ක්‍රියා කරමින් සාගින්නෙන් පෙළෙන අපගේම අසැල්වැසියාට, දනට පිනට දීමට අපගේ සිත් මෘදු වේ නම් ආදරය නො දක්වන, අහිංසක අසරණ අය කෙරෙහි අනුකම්පාව දක්වන්නේ නම් මළවුන්ට පමණක් නොව ජීවතුන්ට කරන මහත් ක්‍රියාවකි. මළවුන් වෙනුවෙන් යාච්ඤා කිරීම, ජීවතුන්ට ශක්තියක් සහ සැනසීමක් වීම අපගේ විශ්වාසය ද තව තවත් තහවුරු කරයි. මරණය දෙස බැලිය යුත්තේ බියජනක දෙයක් ලෙස නොව දේව ආදරය ප්‍රකාශ කරන්නක් ලෙස ය. පවුලේ කෙනකු අපෙන් වියෝ වූ විට ඇති වන හිඩැස වෙන කිසිවකුට කිසිදා පිර විය නො හැකිය. එය

අප තුළ ඇති කරවන වේදනාව හා හුදෙකලාව බොහෝ දුරට සමනය කරන්නට උපකාර වෙයි. එපමණක් ද ජීවිතයේ මුහුණ දෙන විවිධාකාර ගැටලු වලට එඩිතරව මුහුණ දීමට පිටිවහලක් ද වෙයි. මළවුන්ට දැක්විය හැකි උතුම් ම සැලකීම වන්නේ අපගේ දිවිය අරුත්බරව ගත කොට දෙවිඳුන්ට සමීප වීම යි. කෙනකු මිය ගියාට පසුව මල් වඩමක් තබනවාට වඩා එම තැනැත්තා ජීවත් ව සිටි කාලය තුළ එක මලක් ආදරයෙන් දීමට හැකි වූවා නම් එය සත් ක්‍රියාවකි.

දේව දරුවන් වන අපට කිසි දිනෙක මැරෙන්නට නො හැකි ය. මැරෙන්නෙත් අපේ ශරීරය පමණි. දෙවියන් වහන්සේ දුන් ආත්මය පවත්වා ගෙන සිටින ශරීර කුඩුව තනන්නට ගොස් අප ගෞරව පුදන්නේ ඒ නිසා ය. වටිනා ආත්මයන් කිසි දිනෙක නොරිදවන ලෙස ජීවත් විය යුතු වේ. සෑම කිතුනුවකුට ම මේ අගනා දීමනාව දෙවියන් වහන්සේගෙන් තිළිණයකි. අප සැම ජීවත් වන කාලය තුළ තණ්හාව, වෛරය, ක්‍රෝධය, ඊර්ෂ්‍යාව, පලිගැනීම පහ කර ගනිමින් සතුට සැනසීම ආදරය පිළිගැනීම තුළ බෙදා ගනිමින් ජීවත් වීමට වෙර දැරිය යුතු වේ. දේව වචනය අසා ඒවා අදහා ගෙන පිළිපදින අයවලුන් ය. යහපත් ලෙස ජීවත් වෙමින් උන්වහන්සේට අභිමතය නො වූවන් සදාකාලික සොහොන් ගැබේ අන්ධකාරය තුළ හැර දමනවා විය නො හැකි ද? මේ ලෝකය තුළ පාතාලයට හෝ ස්වර්ගයට ගොස් පැමිණ අපට ඔබට, මට විස්තර කීමට හැකි වූ කිසි ම කෙනෙක් නොමැත. එම නිසා ක්‍රිස්තුන් වහන්සේගේ වචනය අසා ඒ අනුව යහපත් ලෙස ජීවත් වෙමු. මරණය ජීවිතයේ අවසානය නොව සදාතනික ජීවිතයේ පටන් ගැනීම බව සිහිපත් කරමින් ජීවත් ව සිටින අප සංවේදිව ජීවත් වෙමින් මිනිසා උරුම කළේ පාපය බව සිහිපත් කරමින් හැමදාමත් ම ඔබ මා සමඟ යි කඳුළු විලේ දී කුණාටුවේදී ඔබ මා සමඟ හිඳිමි යන වචනය සිහිපත් කරමින් ඉපදෙන කා හටත් මරණය නිසැකින් පොදු බව පසක් කර ගනිමු.

කාමන් සකුන්තලා - නාලවලාන මීසම

දෙකී බර දෙසුම්

කති බොති නටති උඩ පැන පැන තරු — බලති
නැති බැරි දනන් ළඟ නත්තල ඉකි — බිඳති
දෙති බර දෙසුම් පදරුත් කවි ගොමු — තනති
එති යති පුරුදු ලෙස නත්තල් රෑ — මැකෙති

ගවලෙන තනා මන්දිර ගේ මැද — සාලේ
දිළිසෙන නත්තලට ඇඳ බැඳගෙන — ආලේ
අපමණ නැටුම් කෙළි පෙන්නා මන — ලෝලේ
රඟ දෙන දනන් කොහොම ද නැළවෙන — තාලේ

බත් ඇති තැනට කොස් පුරවන — විපරිතය
අතහැර නොමැත තවමත් ඒ කළු — මතය
නත්තල මෙය නොවේ හරි දේ හොඳ — හිතය
ලත් හොඳ හිතක ඇඳී රෑ කිතු හිමි — වතය

එනවා පුරුදු ලෙස නත්තල් — සමරනවා
මොනවා කොහොම හරි කර කර — නැළවෙනවා
පුරවා හොඳට බඩකට තව — පුරවනවා
ගලවා නත්තල් සැරසිලි — නිදියනවා

එනවා ඔන්න නත්තල් විකුණන් — කනවා
නිමවා එයට නත්තල් ගස් පැළ — වෙනවා
පුරවා පැතුම් ගම රට වට — ඇවිදිනවා
පලවා දහම ගවලෙන වැඳ පුද — යනවා

ගවලෙන තුළින් ඇති කළ මහ — විමුක්තිය
නොමියන සදා අත්හළ පව — අයුක්තිය
සනසන ලොව ම සාමය පින — කැමැත්තිය
යහගුණ පමණි අවගුණ ගැන — නොදැත්තිය

උත්තම පරම ජේසුස්ගේ උපත — ගැන
ලත් ගුණ සුවඳ ආලෝකය රැඳෙන — තැන
නෙත් හැර බලමු එතැනට හිමි වඩින — එන
සත්තය එයයි හිරු සලු සේ එළිය — දෙන

පිටිපන - මා ජයවීර

දෙවිඳු වාසභවනය ස්ථිර වාසස්ථානය යි.

අපි කිසිත් නැතිව හිස් දැත මිටි මොළවා ගෙන මෙලොව ජනිත වීමු. නමුත් අප හිස දරා පැමිණියේ කුමක් ද? ජන්ම පාප දෝෂය යි. එය කෙලෙසක අප වෙත පැවරිණි ද? පාපය සහ මරණයේ මාවතෙහි මිනිස් වර්ගයා ගෙන යාම ආදම් සහ ඒව විසින් ආරම්භ කෙරිණි. නමුත් දෙවියන් වහන්සේ මනුෂ්‍යයා මැව්වේ පාපයේ මඩ ගොහොරුවේ වැටී මිය යාමට නොවේ. පටන් ගැන්මේ සිට ම උන්වහන්සේගේ අරමුණ වූයේ සතුටුදායක නීරෝගිමත් ජනතාවකගෙන් ලෝකය පිරවීම යි. එම අරමුණ උන්වහන්සේ වෙනස් නො කළ සේක. දේව අරමුණ අලුත් කර පාපයට වැටුණ මිනිසා නඟා සිටුවීමට දෙවියන් වහන්සේ නව ක්‍රියා මාර්ග යක් පිළියෙල කළ සේක. එනම් උන්වහන්සේගේ ඒක ජාතක පුත්‍රයා ව මෙලොවට එවා සකල මනුෂ්‍යයාව ම ගලවා ගැනීම යි. නව ගිවිසුමකින් නව පාලනයකින් මිනිසා පණ ගැන්වීම උන්වහන්සේගේ අදහස විය.

ධර්මිෂ්ඨකම වාසය කරන අලුත් අහසක් ද අලුත් පොළොවක් ද දෙවියන් වහන්සේ පොරොන්දු වූ සේක. එය අපි බලාපොරොත්තු වෙමු. එතෙක් බලා සිටිමු.

“ධර්මිෂ්ඨකමට වාස භූමිය වූ නව අහසක් ද නව පොළොවක් ද දෙවියන් වහන්සේ අපට පොරොන්දු වී ඇත”(2 පේදුරු 3 : 13).

මේ අලුත් අහසත් පොළොවත් භෞතික ඒවා නොවේ. දැන් පවතින මේ අහසත් පොළොවත් දෙවියන් වහන්සේ සියල්ලන් පරිපූර්ණ ව මැවූ සේක.

“සියතින් ඔබ නිම කළ අහස් තලය ද ඔබ පිහිටවූ සඳ මඬල ද තරු වැල් ද මා නරඹන කල්හි...”

(ගීතාවලිය 8 : 3)

යනුවෙන් ගීතිකාකරුවා ගයන්නේ ඒ සියල්ල සර්ව සම්පූර්ණ බැවිනි. මේ අහසත් පොළොවත් කෙරෙහි අලුත් පාලන ක්‍රමයක් පෙන්නුම් කරයි. දැන් පවතින්නේ මනුෂ්‍ය ආණ්ඩු ක්‍රමයකි. මේවා පහව ගොස් ස්වර්ගීය ආණ්ඩුවක් පිහිටවනු ඇත. එහි පාලකයා දෙවි පියාණන් වහන්සේ ය. එහි කොටස්කරුවන් උන්වහන්සේගේ විශ්වාසවන්ත අනුගාමිකයන් වනු ඇත.

“ඔවුහු මේ අලුත් ගීතය ගායනා කළහ. පොත ගන්නටත් එහි මුද්‍රා කඩන්නටත් සුදුසු තැනත් වහන්සේ ඔබය. මන්ද, ඔබ මරනු ලැබ ඒ මරණය නැමැති මිලයෙන්.... මිනිසුන්, දෙවියන් වහන්සේ උදෙසා ලබාගත් සේක... ඔබ ඔවුන් රාජකීය පූජක වංශයක් කළ සේක. ඔවුහු මිහිපිට රජකම් කරන්නාහ”

(එළිදරව්ව 5 : 9-10)

මෙලෙස අපට විශාල කාර්යභාරයක් පැවරී ඇත. එනම් මෙලොව පාලනය කිරීමට ය. සංවර්ධනය කිරීමට ය. ආරක්ෂා කිරීමට ය. මේ කාර්ය භාරය නොපිරිහෙළා ඉටු කිරීමට අපි බැඳි සිටිමු. ලෝකාරම්භයේ දී ම දෙවියන් වහන්සේ අපගේ කාර්ය භාරය පෙන්වා දුන් සේක. එනම්, **“නුඹලා දරු සම්පත් ලබා වැඩි වර්ධනය වී පොළොව පුරා පැතිර එය යටත් කර ගන්න”** යන්න යි. මෙම කාර්ය භාරය ආදම් ඒවගේ පාපය නිසා අවලංගු වූයේ නැත. සිදු වූයේ බාධක දුක් කම්කටොළු මැදින් එය සිදු කිරීමට සිදු වීම යි. මේ සඳහා යහපත් ආකල්පයන්ගෙන් අපි පරිපූර්ණ විය යුතු ය. එවිට එකිනෙකා සමඟ යහපත් වූ සම්බන්ධතාවන් ගෙන් බැඳී, ආදරය ප්‍රේමය ලෝකය තුළ වර්ධනය කළ හැකි වේ. ආදරයෙන් ප්‍රේමයෙන් පිරුණු මිනිසුන් සිටින ලෝකයක දුෂ්චරිත වැරදි ක්‍රියා සිදු නොවනු ඇත. එම නිසා මෙලොවට පැමිණි අප අපගේ ජීවිත කාලය තුළ අපගේ උපරිම ශක්තියෙන්, ක්‍රිස්තුස් වහන්සේ අපට දැක්වූ ප්‍රේමයට සමාන ප්‍රේමයක් ලෝකයාට ප්‍රකාශ කළ හැකි වන්නේ ය.

අප යහපත් ලෙස ජීවිතය ගත කළත් අයහපත් ලෙස ජීවිතය ගත කළත් කවදා හෝ කෙලෙසක හෝ මෙලොව හැරදා යාමට සිදු වේ. ඇතැම් ආගමික දර්ශනවල ඉපදීම දුකක් වේදනාවක් ලෙස උගන්වා යි. දුක වේදනාව තුළින් බොහෝ ජීවිත පාඩම්, අත්දැකීම් අපට උගත හැකි ය. නමුත් ප්‍රීතිය පමණක් සෙවීමෙන් ජීවිතයේ යථාර්ථය අපට අවබෝධ නො වනු ඇත. උගත යුතු බොහෝ දෑ අතපසු වනු ඇත. මිනිස් සමාජයේ හිතවත්කම් මිතු දම් ලියලන්නේ දුක් වේදනාවලින් යැ යි කීම නිවැරදි ය.

කවර හෝ පරමාර්ථයන් සඳහා ජීවිතය කුමන ආකාරයෙන් සාක්ෂාත් කර ගත්තත්; ජීවිතය අනිත්‍ය යි. ධර්මිෂ්ඨයා ද අධර්මිෂ්ඨයා ද එක ලෙස මරණයට පත් වෙයි. ඇතැම් විට සමාජයේ නරක යැ යි සම්මත මිනිස්සු බොහෝ කල් ජීවත් වෙති. මෙයින් ධ්වනිත වන්නේ අයහපත්කමට දුෂ්ටකමට මරණය විපාකයක් නොවන බව යි. මිනිසුන් තුළ ධර්මිෂ්ඨකමේ සම්මතයක් ඇත. ඒ දෙවියන්ගෙන් ලැබෙන තිළිණයකි. අප මෙලොව කෙලෙස ජීවත් වූවත් දෙවිඳුන්ගේ තීරණයට කොයි කවුරුත් යටත් විය යුතු යි. උන්වහන්සේ දින නියම කරන විට දී මිනිසාට මෙලොව හැර යාමට සිදු වේ. දෙපයින් මෙලොවට පැමිණෙන මිනිසා අට පයින් අවසන් ගමන් යයි. එවිට විලාප නඟන්නෝ ද පෙරහැරේ යති. සිරුර පොළොවට පස් වෙයි. එවිට ආත්මය? එය දුන් දෙවිඳුන් වෙත යන්නේ ද?

ඊළඟ පියවර අපගේ අවසාන විනිශ්චය යි. ක්‍රිස්තුන් වහන්සේ මෙලොව හැර යද්දී අපට කිවේ; “**මාගේ පියාණන් වහන්සේගේ නිවාසයෙහි වාසය කිරීමට ඉඩ පහසු තැන් බොහෝ ඇත. .... ඔබට ස්ථානයක් සූදානම් කරන පිණිස යමි. මා ගොස් ඔබට ස්ථානයක් සූදානම් කළ විට මා සිටින තැන ඔබත් සිටින පිණිස ඔබ කැඳවාගෙන යාමට මම නැවත එන්නෙමි**”

(ජොහන් 14 : 2-3)

සමිදාණන් අපව රැගෙන යාමට තේජශ්‍රීයෙන් නැවත වඩින බව අපි විශ්වාස කරමු. ක්‍රිස්තුස් වහන්සේ තම ජීවිතය අප වෙනුවෙන් පුජා කළ විට දෙවියන් වහන්සේ උන්වහන්සේ ව අතිමහත් තේජශ්‍රීයෙන් උත්ථාන කළ සේක. උන්වහන්සේට මෙලොව තිබූ ජීවිතයට වඩා; කියා නිම කළ නොහැකි උසස් තත්ත්වයකින් නැඟිටුවා තමන් ළඟට ගත් සේක.

නැවත නැඟිටුවීම වනාහි පුදුමාකාර ආශ්චර්යයකි. මළාවූ තැනැත්තා ජීවිත කාලය පුරා ම තම අත්දැකීම්, දැන උගත්කම්, මතකයන් මහත් සම්භාරයක් එක් රැස් කරගෙන සිටී. නමුත් මිය ගිය සැණින් ඒ සියල්ල ම අර්ථ ශූන්‍ය වෙයි. බොල් වී යයි. මළාවූ අය නැවත නැඟිටින්නේ කෙලෙස ද? භෞතික ශරීරයක් ඇතිව ද? නැතිව ද? යන්න කිසිවෙකුත් දන්නේ නැත. නමුත් බයිබල් ඉගැන්වීම් තුළින් අප නැවත නැඟිටින බවත් විනිශ්චයට ලක්වන බවත් විශ්වාස කරමු.

“**එවිට යහපත කළ අය සදාතන ජීවනය සඳහා උත්ථාන කරනු ලබති. අයහපත කළ අය විනිශ්චය සඳහා උත්ථාන කරනු ලබති**” (ජොහන් 5 : 29).

අප මේ ලෝකයට පැමිණියා සේ ම නැවත පිටවී යාමත් ස්ථිර ය. නැවතත් අපව ගෙන්වීම නැතහොත් නැඟිටුවීම ගැන දන්නේ දෙවියන් වහන්සේ පමණි. නමුත් අනිවාර්යයෙන් ම අපව උන්වහන්සේගේ වාස භවනට රැගෙන යන බව ස්ථිර ය. එතැනට යනවා පමණි, නැවත එතැනින් ආපසු එන්නේ නැත. ස්ථිර වාසස්ථානය එතැන ය. ඒ සඳහා ධර්මයෙහි හැසිරීම අනිවාර්ය වේ. අවසන් විනිශ්චය සඳහා ක්‍රිස්තුස් වහන්සේ නැවත මෙලොවට වඩින බව ස්ථිර ය. ඒ බව උන්වහන්සේ මෙලෙස කියා ඇත.

“**එකල මනුෂ්‍යපුත්‍රයාණන් බල පරාක්‍රමයෙන් ද මහා තේජශ්‍රීයෙන් ද වලාකුළක් මත වඩිනු ඔවුහු දකින්නෝ ය. මේ දේ සිදුවන්න පටන් ගන්නා කල ඔබේ විමුක්තිය ළං වේගෙන එන බැවින් නැඟී සිට හිස ඔසවන්න**” (ලූක් 21 : 27 - 28)

ඇග්නස් චන්ද්‍රකාන්ති ජයමාන්න
සියඹලාපේ.

අලුත් බලාපොරොත්තුව - නිහඬ සමුගැනීම

මම මේ මාතෘකාව මුලින්ම දැකපු ගමන් හිතුවා මොකක් ද මේ ගැන ලියන්න පුළුවන් කියලා. මුලින් ම හිනාත් ගියා. පස්සේ තමයි මට කල්පනා වුණේ, මේක ගොඩක් ලස්සන දේවල් ලියන්න පුළුවන් හොඳ වචන දෙකක් කියලා. පස්සේ ලියන්න ගත්තා. අදහස්, සිතුවිලි එනවා, යනවා. මොකද ලස්සනට ලියන්න පුළුවන් කතා ගොඩක් මෙම වචන දෙක ඇතුළේ තියෙනවා, අපේ ජීවිතය ගැන.

ජීවිතය කියන්නේ හරියට ම ලොකු දුම්රිය ස්ථානයක් වගේ. කෝච්චි ‘එනවා යනවා’, මිනිස්සුත් කෝච්චියෙන් ‘එනවා-යනවා’ අපේ ජීවිතයටත් එක පැත්තකින් මිනිස්සු ‘එනවා’, අලුත් බලාපොරොත්තු, අලුත් හිනා, අලුත් ආරම්භයක් එක්ක. අනිත් පැත්තෙන් මිනිස්සු ‘යනවා’ මතක, කඳුළු සමහර විට නිහඬ සමුගැනීම් එක්ක. අපි හැමෝමත් කාගේ හරි ජීවිතයකට ‘එනවා’, කෙනෙක්ගේ හිතේ වසන්තයක් වෙන්න. ඒ වගේම කාගේ හරි ජීවිතයෙන් ‘යනවා’ මතකයක් වෙලා, පාඩමක් වෙලා.

අපේ ළමා කාලයේ දී ‘එනවා’ යාළුවෝ, නිවාඩුව, කැවිලි පෙවෙලි, ඒ වගේම ‘යනවා’ අපේ බය, බොළඳකම. අපේ තරුණ කාලයේදී ‘එනවා’ ආදරය, සිහින, වගකීම්. අපෙන් ‘යනවා’ නිදහස, නින්ද, අපේ අතීතය.

අම්මා කියනවා ‘එනවා’ කියන්නේ බලාපොරොත්තුව කියලා. තාත්තා කියන්නේ ‘යනවා’ කියන්නේ ඉවසීම කියලා. ඇත්තටම අපි ‘යනවා’ කියලා හිතන හැම දේ ම, වෙනත් තැනක වෙනත් අවස්ථාවකදී ‘එනවා’ අපි ‘එනවා’ කියලා හිතන හැම දේ ම, දවසක ‘යනවා’ .

ඉතින් ‘යන’ නිසා දුක් වෙන්න එපා, ඒ වගේම ‘එන’ නිසා බය වෙන්නත් එපා. මොක ද ජීවිත රෝදේ හැම දා ම කරකැවෙන්නේ ඒ වචන දෙකෙන්. “එනවා, යනවා”. ඒ අතරේ අපි ඉන්නවා.

ඉමාන් අබේරත්න
දකුණු බටගම, කඳාන.

කිතුනු අනුගාමිකත්වයේ දිවැසිවර පරිකල්පනය

අද ලෝකය බොහෝ විට ක්‍රියාත්මක වන්නේ "ආධිපත්‍යයක චින්තනය" (dominant consciousness) හෙවත් අධිරාජ්‍යය ගොඩනැඟීම, බලය තහවුරු කර ගැනීම, භීතිය පැතිරවීම සහ අධික තෘෂ්ණාව මත පදනම් වූ මනෝභාවයක් මඟින් ජනතාවගේ දුක දොම්නස හිරිවට්ටමින්, යටපත් කර අසාධාරණය සාධාරණීකරණය කිරීමෙන් ය. මෙම අදහස, දේවධාර්මික ප්‍රාඥයකු වූ වොල්ටර් බෘගෙමාන් (Walter Brueggemann) ගේ "Prophetic Imagination" (ප්‍රොෆෙටික් ඉමැජිනේෂන්) පොතෙහි ඉස්මතු කර පෙන්වන ප්‍රධාන කරුණකි. ඔහුගේ මතය වන්නේ කිතුනුවන්ට ප්‍රධාන දිවැසිවර වගකීම් දෙකක් පැවරෙන බවයි. පළමුව, සමාජය තුළ මුල් බැස ඇති අසත්‍ය සහ පීඩාකාරී සමාජ රටාවන් දිවැසිවර විචාරණයට සහ විවේචනයට (prophetic critcising) ලක්කිරීමත් දෙවෙනුව, සමස්ත දේව මැවිල්ලේ සමෘද්ධිය වෙනුවෙන් දේව කරුණාව, බලාපොරොත්තුව මෙන් ම විකල්පිත සමාජ දැක්මක් කෙරෙහි ජනතාව තුළ දිවැසිවර ශක්තිජනනය සහ බල ගැන්වීම (prophetic energising) සිදු කිරීමත් ය.

පැරණි ගිවිසුමෙන්

පැරණි ගිවිසුමේ ඊශ්‍රායෙල් ජනතාව අතර වූ රාජ්‍ය පාලනය සහ රාජාධිපත්‍යය ඔවුන්ගේ අසල්වැසි රටවලට වඩා භාත්පසින් ම වෙනස් වූවකි. එම වෙනස කැපී පෙනෙන වඩාත් ම වැදගත්වූ ලක්ෂණය වූයේ තෝරාගත් ජනතාව වශයෙන් ඔවුන්ගේ රාජ්‍ය පාලනය විසින් දෙවියන් වහන්සේගේ නාමයෙන් ජනතාවට නොපසුබට ව සේවය කිරීම සුරක්ෂිත කිරීම සඳහා එම පාලනය නිරන්තර විවේචනයට, වාරණයට සහ පිරික්සීමට යටත් ව පැවතීම ය. තමන් යහපාලකයින් යැයි ඊශ්‍රායෙල් රජවරුන් අතර වූ ආත්ම වංචාවට විරුද්ධව දිවැසිවරු රජවරුන්ගේ නරුම, තුච්ඡ අසමත් වීම විවේචනයට ලක් කළහ. තම අත්තනෝමතික රාජකීයත්වය නිමාවක් නොමැතිව සදාකාලිකව පවත්වා ගෙන යා හැකි යැ යි තිබූ අහංකාර විශ්වාසය ඉදිරියේ දෙවියන් වහන්සේ යනු **"ගොඩනඟන, සිටුවන, උදුරා දමන, කඩා දමන, නැති කරන හා හෙළා දමන"** (1:10) දෙවි කෙනෙකු බව ජෙරමියා දිවැසිවරයා තරයේ මතක් කර දුන්නේ ය. තම දිවැසිවර දූත මෙහෙවර, එවකට පැවති රාජ්‍ය බලය සමඟ අත්වැල් බැඳ ගැනීමට ජෙරමියාට ඉඩ දුන්නේ නැත. ඒ වෙනුවට නව ආරම්භයක් සහ විකල්ප සමාජයක් යෝජනා කරන්නට පෙළඹී ය. තම දිවැසිවර දැක්ම දේශපාලන භාෂිතයට යොදමින් ජෙරමියා දිවැසිවරයා බැබිලෝනියානු තර්ජනය පිළිබඳව අනතුරු හඟවමින් එදා සිටි පාලකයින්ටත්, අශික්ෂිත පාලනයටත් විරුද්ධව තම හඬ නැගුවේ ය.

දිවැසිවර ක්‍රියාවලියේ පරමාදර්ශය

ශුද්ධවූ සුවිශේෂ තුළින් අපට හමු වන ජේසුස් වහන්සේ මෙම දිවැසිවර කැඳවීමේ පරමාදර්ශය පිළිබිඹු කරයි. ජේසුස් වහන්සේ තම කාලයේ පැවති රාජ්‍ය පාලනය පිළිබඳව දැරූ ආකල්ප, එකල පැවති පාලනය හා අනුබද්ධ වූවක් නො වන බව සක් සුදක් සේ පැහැදිලි ය. උන්වහන්සේ, හෙරෝද් රජුට "හිවලා" යැයි අමතමින් තම කාලයේ වූ ජුදා නායකයින්ව මෙන් ම අන්‍ය ජාතික පාලකයින් ද විවේචනයට ලක් කළ සේක. **"අන්‍ය ජාතීන්ගේ රජවරු ඔවුන් කෙරෙහි අධිපතිකම් පවත්වති..."** (ලූක් 22:17) යැයි පවසමින් එවකට පැවති ජරාජීර්ණ වූ ආධිපත්‍යය සහ දූෂිත පාලනයට අභියෝග කළ සේක. ඒකාධිපති පාලනයක් ගෙන යමින් සිටි රෝම අධිරාජ්‍යයට විරුද්ධව **"සේසරුගේ දේ සේසරුටත් දෙවියන් වහන්සේගේ දේ දෙවියන් වහන්සේටත් දෙන්නැයි"** (මතෙව් 22:21) ක්‍රිස්තුස් වහන්සේ හඬ නැඟූ සේක. දේව මාළිගාව වටා ගොඩනැඟී තිබූ ආගමික පාලනයේ දූෂිත ක්‍රමවේද උන්වහන්සේ තරයේ හෙළා දුටු සේක.

ජේසුස් වහන්සේ යුක්තිය සහ සාධාරණත්වය පිළිබඳ දේශනා කිරීමෙන් පමණක් නො නැවතී ක්‍රියාවෙන් ද යුක්තිය හඹා ගිය සේක. උන්වහන්සේගේ දයා කරුණාව හැඟීමට පමණක් සීමා නො වී ය. පවතින ක්‍රියා පිළිවෙළට අභියෝග කරමින් ඒවා කඩා බිඳ දමමින් දේව කරුණාව, එනම්,

දෙවියන් වහන්සේගේ ම වේදනාව, දයානුකම්පාව සහ ප්‍රතිසාධනය කිරීමට ඇති දැඩි කැපවීම හේතුවෙන් නැවුම් ශක්‍යතාවන් පොහොණි කරන නායකත්වයක් උන් වහන්සේගේ සේවාවෙන් ප්‍රදර්ශනය කළ සේක.

ජොහන් සුවිශේෂයේ **"ඔබ ලෝකයේ ආලෝකය ය"** (8:12) යැයි ජේසුස් වහන්සේගේ ප්‍රකාශය, පෙර සඳහන් කෙරුණු දිවැසිවර ද්විත්ව කැඳවීම නින්නාද කරවයි. අලෝකය එක්වර ම ක්‍රියාවන් දෙකක් සිදුකර යි. එනම්, පළමුව, ආලෝකය විසින් අඳුර පලවා හරිමින් අඳුරට මුවාවී ඇති අයුක්තිය, අසත්‍යය සහ පොදු විනාශය නිරාවරණය (විවේචනය) කරයි. දෙවෙනුව, ආලෝකය මඟින් ජීවයේ වර්ධනයට අවැසි උණුසුම, සුවය සහ දිශානතිය සපයමින් යහ පරිවර්තනයක් පොහොණි (ශක්ති ජනනය) කරයි. ජේසුස් වහන්සේ, සැබෑ ආලෝකය බවට පත්වන්නේ උන්වහන්සේ අඳුර නිරාවරණය කරමින් ජීවනදායක බලාපොරොත්තුව උපදවන නිසා ම ය.

තම පියාණන් වහන්සේගේ අභිප්‍රාය වන සමස්ත විශ්වයේ ගැලවීමේ මෙහෙවර (Missio Dei) විකෘති කරන ක්‍රමවේදයන් ජේසුස් වහන්සේ විසින් විචාරණය කරමින්, විවේචනය කළ සේක. නිදසුන් වශයෙන්,

- ජෙරුසලෙම් දේව මාළිගාවේ ධනයට ඇති ගිජුකම මඟින් දිළින්දන්ව ගසාකෑම එළිපිට විවේචනයට ලක් කරමින් **"මාගේ ගෘහය සියලු ජාතීන්ට යාච්ඤා ගෘහයකැ යි කියනු ලබන්නේ යැ යි ලියා තිබෙනවා නොවේ ද? නමුත් නුඹලා ඒක සොරුන්ගේ ගුහාවක් කළාහු යැ යි කී සේක"** (මාක් 11:17). මෙය ආගම දඩමීමා කරගත් ආර්ථික අසාධාරණය පිළිබඳව උන්වහන්සේ දැඩි සේ එල්ල කළ දිවැසිවර විවේචනය යි.
- තමන් භුක්ති විඳින වරප්‍රසාදයන් රැක ගනිමින් (මතෙව් 23) අන් අය මත බර පටවන සහ අන් අයගේ ගරුත්වය කෙළෙසන නායකයින්ගේ කෙරාටික පැවැත්ම අභියෝග කළේ ය.
- සාමය ළඟා කර ගත හැක්කේ අනෙකාව යටපත් කිරීමෙන් යැයි පවසමින් අධිරාජ්‍යය විසින් පවත්වාගෙන ආ අන් අය නිහඬ කිරීමේ ක්‍රමය පිළිකෙව් කරමින් ඒ වෙනුවට නැවතත් අන්‍යෝන්‍ය සබඳතා පිළිසකර කෙරෙන සාමයේ (Shalom) මඟ තෝරා ගත්තේ ය (මාක් 5:34; ලූක් 7:50; ජොහන් 14:27; 20:19-21 සහ 26).
- පක්ෂීන් මෙන් ම පරිසරය පිළිබඳව දෙවියන් වහන්සේගේ දයාව සහ රක්ෂණය පිළිබඳව දේශනා කරමින් (ලූක් 12:24-28), මිනිසුන් විසින් දේව මැවිල්ල විනාශ කිරීම ගැන විවේචනය කළේ ය.

දිවැසිවර විචාරණය සහ ශක්ති ජනනය කිතුනු අනුගාමිකත්වය තුළ සංකලනය කිරීම

පවතින සමාජ රටාව කඩා බිඳ දමමින් ජේසුස් වහන්සේ ප්‍රේමය, දයාව, යුක්තිය සහ සාමුහික දූත මෙහෙවරක් මත පදනම් වූ විකල්පීය සංඝයක් බිහි කළේ ය (ජොහන් 13:35; ලූක් 4:18-19). පවතින තත්ත්වය පෙරළා දැමීම යනු ඉච්ඡාභංගත්වය නොවන බවට ද එමඟින් සාක්ෂි දැරී ය. අද දවසේ කිතුනු අනුගාමිකයින්ට පැවරී ඇති කැඳවීම ද එවන් අවිනිශ්චිත තත්ත්වයන් මැදින් සමාජය මෙහෙයවීම ය.

ජේසුස් වහන්සේ විසින් දිවැසිවර විචාරණය (prophetic critcising) සිදු කළේ, සත්‍ය ප්‍රකාශ කිරීම, පවතින තත්ත්වය බිඳ හෙළීම, පීඩාකාරී රටාවන්ට අභියෝග කිරීම වැනි ක්‍රියාවන් මඟිනි. එම ආදර්ශය පිළිපදිමින් අද කිතුනුවන්ට දිවැසිවර විචාරණය සිදු කළ හැකි වන්නේ අභ්‍යන්තර (තම සභාව තුළ) සහ බාහිර අයුක්තිය පිටුදැකීම, බල අධිකාරිය ඉදිරියේ සත්‍ය පැවසීම, බිය වැද්දීම තුළ පවත්වා ගෙන යන පාලන ක්‍රමය හෙළා දැකීම වැනි ක්‍රියා මඟින් ය.

දිවැසිවර බලගැන්වීම (prophetic energising) යනු සර්ව ශුභවාදය නොව, ඒ වෙනුවට දිවැසිවර ක්‍රියාවලිය මඟින් අන් අයගේ කම්පාව සහ ඔවුන් කෙරෙහි ඇතිවන ගැඹුරු අනුකම්පාව නිසා උත්පාදනය වන ශක්තිය සහ බලය බව බෘගෙමාන් පවසයි.

21 වන පිටුවට ...

ශිරන්ත පෙරේරා
ඔස්ට්‍රේලියාව.

ප්‍රසාදජනක තෝරා ගැනීම හා පොදු ධර්මතාව

ලෝකය අපට නවාතැන්පළකි. අප එහි තේවාසික ව ගත කරන්නේ ඉතා කෙටි හා සීමිත කාලයකි. කිතුනු විශ්වාසයට අනුව අපගේ මිනිස් උපත සිදු වන්නේ දෙවියන් වහන්සේගේ ප්‍රසාදජනක තෝරා ගැනීමක් ලෙස ය. මෙලොව දී අප යම් නිපුණතාවක් ලබන්නේ ද දේව තලෙන්තුවක් ලෙස විශ්වාස කිරීමට පෙලඹී සිටිමු. මෙලොව දිවියේ අවසානය හෙවත් මරණය පොදු ධර්මතාවක් වුව ද එය අප ලද ආත්මය දේව හස්තයට පිළිගැනීමක් කොට සැනසීමට පත් විය හැකි මාර්ගයකි.

කතෝලික සභාව නොවැම්බර් මස පළමු වැනි දා සියලු සාන්තුවරයන්ගේ මංගල්‍යය සමරන අතර නොවැම්බර් මස දෙවන දින සමරනු ලබන්නේ මළවුන්ගේ මංගල්‍යය යි. එය දේව වන්දනා වර්ෂයේ සඳහන් කර ඇත. මළවුන් සිහිපත් කිරීමට අප ඒකරාශී වන්නේ සුසාන භූමි වෙතට ය. ඇතැම් අවස්ථාවල සොහොන් ඇති ස්ථාන වෙත ගොස් යාච්ඤා කිරීම ද සිරිතකි. එම ක්‍රම දෙකට ම වඩා වෙනස් අන්දමකින් මෘත ශරීර තැන්පත් කර ඇති සිරස් සොහොන් සංකීර්ණයක් මග්ගොන කුරුස කන්දේ දී අපට දැක ගත හැකි ය. එහි දැවැන්ත කුරුසිය පා මුල පිටුපස කුටීර ක්‍රමයට නිර්මාණය කර ඇත. එහි සිරස් අතට පේළි දෙකට පිහිටා ඇති සොහොන් ගණන දොළහකි. ඒ එක් පේළියකට හය බැගින් පේළි දෙකක් වශයෙනි. එහි මිහිදන් කර ඇත්තේ විදෙස් ධර්මදූතවරුන් ය. ඔවුන් සියලු දෙනා ම නිර්මල මරිය නිකායික විදෙස් ධර්මදූත පැවිදිවරුන් ය. ඔවුන් ප්‍රංශය, ඉතාලිය හා බෙල්ජියම යන රටවලට අයත් පැවිදිවරුන් ය. පොළොවේ හරස් අතට කණින ලද කුටීරවල එම මෘත දේහ තැන්පත් කර ඇත.

Catacum (කැටකුම්) ලෙස හඳුන්වන එම ලාච්චු සුසානයේ තැන්පත් කර ඇති ධර්මදූත පැවිදිවරුන්ගේ නාමාවලිය මෙසේ ය. වම් පස ඉහළ සිට පහළට ගරු ස්ටේෆන් ඩුරා සහෝදරතුමා, ගරු ලියෝ රෙනවුඩ් සහෝදරතුමා, ගරු ඇන්තනි වර්නට් පියතුමා, ගරු ලුඩොවිකස් ටිලට් සහෝදරතුමා, ගරු ප්‍රැන්සිස් කෝගෝරි පියතුමා, ගරු ජෝන් එම් තොරවල් සහෝදරතුමා. දකුණු පස ඉහළ සිට පහළට ගරු හෙන්රි මාකස් පියතුමා, ගරු වින්ස්ටන් සිජ්කා සහෝදරතුමා, ගරු ප්‍රැන්සිස් බීසින් පියතුමා, ගරු ඩොමිනිකෝටුෆි සහෝදරතුමා, ගරු එවුජින් කොම්ස් පියතුමා, ගරු ලුඩොවිකස් ලිජ්නා සහෝදරතුමා.

වර්තමානයේ මෙන් සන්නිවේදන ක්‍රම නොදියුණු අතීතයේ ශ්‍රී ලංකාව පිළිබඳව ලෝක සිතියමේ කුඩා දූපතක් ලෙස දැක දැන ගත් පමණින් කිසිදු සැප පහසුකමක් නොපතා අප රටට ධර්මදූත සේවය සඳහා පමණක් ම පැමිණීම අප ලද භාග්‍යයකි.

මළවුන්ගේ මංගල්‍යයට, මළවුන්ගේ මාසයට හෝ චතාරික කාලයට පමණක් නොව දැනට ශ්‍රී ලංකාවේ ඇති එක ම ඓතිහාසික ලාච්චු සුසාන පරිශ්‍රය දැක ගැනීමට එහි අධ්‍යනය කටයුතු කිරීමට ඉතා වටිනා ස්ථානයකි, මග්ගොන කුරුස කන්දේ පිහිටි එම සොහොන් ක්‍රමය.

නිර්මල මරිය නිකාය මඟින් සමාජ සේවා කටයුතු බහුල ව සිදු කරන අතර ඉන් අග්‍ර ස්ථානයට පත්වන්නේ දේව වචනය ව්‍යාප්ත කිරීම යි. නිකායේ නිර්මාතෘ සාන්තුවර එවුජින් ද මැසනඩ් මුනිතුමන්ගේ දයා දූත සේවයේ ප්‍රතිඵලයක් ලෙස පළමු විදෙස් ධර්මදූත පැවිදි පිරිස ප්‍රංශයේ මාසෙල්ස් නුවරින් නික්ම ශ්‍රී ලංකාවට සැපත් වන්නේ, වර්ෂ 1847 නොවැම්බර් මස 21 වනදා ය. එදා සිට අද වනතුරු නිර්මල මරිය නිකාය ශ්‍රී ලංකාවේ මෙන් ම ලෝකයේ රටවල් රාශියක සිය සේවය පහන් තාරකාවක් මෙන් බබලන්නී ය. නිහඬ ව සේවය කර නිහඬ ව ම සමාදානයේ සැතපෙන සියලු නිර්මල මරිය නිකායික පැවිදිවරුනි, ඔබ නිසා අපි භාග්‍යවන්තයෝ වූයෙමු.

මංගල ජයවර්ධන
ගිංතොට.

අරුත්බර නත්තලක් සමරන්නට සූදානම් වෙමු.



නත්තල සෑම වසරක ම දෙසැම්බර් මස 25 දා සමරනු ලබන අතර සෑම වසරක් පාසා ම මේ නත්තල් මංගල්‍යය, 'එනවා යනවා' යැයි කීවාට වරදක් නම් නැත.

නත්තල යනු ජේසුස් වහන්සේ බෙත්ලෙහෙමේ දී ඉපදීම මෙන් ම දෙවියන් වහන්සේ මානව සංහතිය කරා සම්ප්‍රාප්ත වීම සිහිගැන්වීම යි. මීට සියවස් 20කට පමණ පෙර බෙත්ලෙහෙමේ දී දෙවියන් වහන්සේගේ වචනය තෙම මිනිස් වෙස් ගෙන ලොවට වඩින බවට අනාගත වක්තෘන් විසින් අනාදියේ සිට ජනතාවට ප්‍රකාශ කළත් **"උන්වහන්සේ බිලිඳු වෙසින් දිළිඳු බවින් පාළු ගව මඩුවක උපදිනවා ඇතැ යි"** එදා මිනිසුන් දැන සිටියේ නැත. එලෙස දැන සිටියා නම් සුවිසල් මන්දිර දස දහස් ගණනක් මේ අහිංසක යුවල වෙනුවෙන් දොරවල් විවර කර මඟ බලා සිටිනු සැක නැත. මේ නත්තල් මංගල්‍යය ගැන ගරු මර්සලින් ජයකොඩි පියතුමා මෙලෙස අරුත් ගන්වා ඇත.

"මගේ නත්තල දුගියා බත් කන දා ය
මගේ නත්තල වැරහැලි නැති වන දා ය
මගේ නත්තල ඔබෙ දුක සැනසෙන දා ය
මගේ නත්තල් පව පල්ලිය යන දා ය"

ඉතිං මේ වදන් දශක කිහිපයකට පෙර අප සවනට ඇසුන වදන් වූවත්, අද වන විට මෙලොව ජීවත් වන අප රටේ මිනිසුන්ට මෙහි යථාර්ථය කුමක් දැ යි වැටහෙන්නේ නැති ආකාරයට මේ නත්තල් මංගල්‍යය සමරනු ලබයි. කාලා බීලා නටලා ප්‍රීති සන්තෝෂ වන්නටත්, වෙළඳ සැල් අසල නටන නත්තල් පප්පලා කුඨ වෙළෙඳුන්ගේ අතමිට සරු කරවන සර්ව පිත්තල ලෝකයක් පෙන්වන මහා සැණකෙළියක් වගේ මේ නත්තල් දිනය. නමුත් සුබ වදන තුළ අපට පෙන්වා දෙන්නේ පීඩාවට පත් ජනතාව එයින් ගලවා ගැනීමට ගැලවුම්කරුවකු මෙලොවට පැමිණි බව යි. එදා ඒ සුපුවත සුරලොවින් මනුලොවට ප්‍රකාශ කළේ දුගී දුප්පත් එඬේරුන්ට ය.

"අති උසස් තැන්හි දෙවිඳුන්ට මහිමය ද මිහිපිට සුසිත් දනන් හට සාමය ද වේවා"(ලූක් 2:14)

මේ අනුව බලන කල පළමු නත්තල් සාම පැතුම ලැබුවේ දේව වරප්‍රසාදයෙන් පිරුණු මේ එඬේර ජනයා මිස මුළු මිනිස් ලෝකයා ම නොවේ.

නත්තල හුදු වාණිජ උත්සවයක් කර නො ගෙන එහි සැබෑ අරුත තේරුම් ගෙන එය අප සමඟ ජීවත් වන සැමට පහදා දීමට අපට හැකි විය යුතු ය. සමාජ අසාධරණය හමුවේ කොන් වූවන්, දිළිඳු හා පීඩිත වූවන්ගේ වේදනාවලට සංවේදී සැබෑ කිතුනු බවේ අරුත අප හදවත්වලට රඳවා ගෙන අරුත්බර නත්තලක් සමරන්නට අදිටන් කර ගනිමු.

එබැවින් අපගේ හදවත් ගවලෙනක් කර ගන්නටත් ඒ ගවලෙන තුළ උපදින ජේසු සමිඳාණන්ව පිළිගන්නටත් අප සූදානම් විය යුතු ය. අප හදවත් තුළ ජේසු සමිඳාණන්ගේ උත්පත්තියේ සතුට උපරිමයෙන් ම විඳ ගැනීමට සාම කුමාරයාණන්ගේ ආරක්ෂාව අප සැමට ලැබේවා යි පතමු. සුබ නත්තලක් වේවා. !

ප්‍රියන්ති ජසින්තා මෙන්ඩිස් - උතුරු පයාගල

නිවැරදි කිරීම යි !

"පවුලේ මහිමාලංකාරය" නමැති තේමාව යටතේ භක්ති ප්‍රබොධන සඟරාවේ පළවූ "දෙවියන් වහන්සේගේ ප්‍රේමය මිහිමත ජීවමාන කළ හැකි දැවැන්ත සංවිධානය මිනිස් පවුලයි !" යන ලිපිය දුම්මලසූරියේ "ලැරින් ප්‍රියානි ප්‍රනාන්දු" යන නමින් පළ වීම අත්වැරැද්දකි. එම ලිපිය ලියන ලද්දේ වෙන්නප්පුවේ පදිංචිව සිටි ලැම්බට් වාස් ය. ඒ ගැන අපගේ කණගාටුව.

සමාදානයේ සැතපේවා !

කෙසේ නමුත් පසුගිය ඔක්. 08 වන බ්‍රහස්පතින්දා ලැම්බට් වාස් දයාබර පියාණන් සග සුව සැපත් විය. ලැම්බට් වාස් පියාණන් ලේඛකයෙකු ලෙස අප සඟරාවට ලබා දුන් දායකත්වයට අපි කෘතවේදී වෙමු. එතුමන් වෙනුවෙන් අපගේ සංවේගය පළ කරන අතර සමිඳුන් තුළ සදාකාලික ජීවිතය ඔහුට ලැබේවා යැයි අපි ප්‍රාර්ථනා කරමින් දෙවිඳුන් යදිමු.

දිගු ගමනක කෙටි දුර



අපි මේ ලෝකයට එනවා. කාලයක් ජීවත් වෙනවා; මිනිසුන් හමුවෙනවා; බැඳීම් ඇතිකර ගන්නවා; ආදරය කරනවා; තරහ වෙනවා; හිනාවෙනවා; අඬනවා; දිනනවා; පරදිනවා; දේවල් එකතු කරනවා; ඒවා රැකගන්න මහන්සි වෙනවා. අන්තිමේදී ඒ සියල්ල ම මෙහි තබා අපි යනවා.

අපි එන විට අපට කිසිවක් නැහැ. යන විටත් කිසිවක් රැගෙන යන්න බැහැ. නමුත් ඒ පැමිණීමත් පිටවීමත් අතර තිබෙන කුඩා කාල පරාසය තුළ අපි කොපමණ දේවල් අපේ කරගන්න උත්සාහ කරනවා ද?

මගේ ගෙදර; මගේ ඉඩම; මගේ සල්ලි; මගේ තනතුර; මගේ වාහනය; මගේ දරුවෝ; මගේ අදහස; මගේ ගෞරවය.“මගේ” කියන වචනය අපේ ජීවිතයට කොතරම් තදින් බැඳී තිබෙනවාද?

එහෙත් කාලය අපට උගන්වන ලොකු ම පාඩමක් තිබෙනවා. අපි “මගේ” කියා අල්ලාගෙන සිටින බොහෝ දේ ඇත්තට ම මගේ නොවෙයි. ඒවා ටික කාලයකට අපට භාර වූ දේවල් පමණ යි.

අපේ ජීවිතයට මිනිසුන් ද එහෙම යි. සමහරු අපේ ජීවිතයට එන්නේ අප සමඟ දිගු ගමනක් යන්න. තවත් සමහරු එන්නේ කෙටි දුරක් පමණක් අප සමඟ ඇවිදින්න. සමහරෙක් අපට ආදරය උගන්වනවා. තවත් කෙනෙක් වේදනාව උගන්වනවා. කෙනෙක් විශ්වාසය දෙනවා. තවත් කෙනෙක් විශ්වාසය බිඳ දමනවා. කෙනෙක් අපේ ජීවිතයට පැමිණීම ගැන අපි සතුටු වෙනවා. තවත් කෙනෙක් පිටව යාම ගැන කාලයක් දුක් වෙනවා.

නමුත් වසර ගණනකට පසු හැරී බලන විට තේරෙනවා ඒ හැම කෙනෙක් ම අපට යමක් ඉතිරි කර ගොස් ඇති බව. අපේ ජීවිතයට පැමිණි සියලු දෙනා අප සමඟ ම සිටිය යුතු නැහැ. එය පිළිගැනීම පහසු දෙයක් නොවේ.

අපි ආදරය කළ අය වෙනස් වෙනවා. මිතුරන් දුරස් වෙනවා. දරුවන් ලොකු වී තමන්ගේ ලෝක ගොඩනඟා ගන්නවා. අප සමඟ වැඩ කළ අය විශ්‍රාම යනවා. අපිත් විශ්‍රාම යනවා. අපට පෙර ගිය වැඩිහිටියන්ගේ පුටු හිස් වෙනවා. දවසක අපේ පුටුවත් හිස් වෙනවා.

ඒ තමයි ජීවිතය.

තරුණ කාලයේ දී අපට මේ සත්‍යය එතරම් දැනෙන්නේ නැහැ. ඉදිරියට තව බොහෝ කාලයක් තිබෙනවා යැයි සිතෙනවා. “පස්සේ කතා කරමු”, “වෙලාවක හමුවෙමු”, “දවසක යන්නම්”, “පස්සේ සමාව ඉල්ලන්නම්” කියමින් බොහෝ දේ කල් දමනවා. නමුත් ජීවිතය අපේ දින දර්ශනය බලලා වැඩ කරන්නේ නැහැ. සමහර දුරකථන ඇමතුම් අපි නොගන්නවා. සමහර මිතුරන් හමුවීම කල් දමනවා. අමනාපකම් අවුරුදු ගණන් තබාගන්නවා. සමාව ඉල්ලන්න ලජ්ජා වෙනවා. සමාව දෙන්න අහංකාර වෙනවා.

එහෙත් කෙනෙක් සදහට ම ගිය පසු, අපිට මතක් වෙන්නේ ඔහු අපට ණය වූ මුදල නොවෙයි. ඔහුගේ තනතුරත් නොවෙයි. ඔහු ඇඳපු ඇඳුමවත්, පාවිච්චි කළ වාහනයවත් නොවෙයි.

මතක් වෙන්නේ කුඩා දේවල්.

එක සිනහවක්.

එක වචනයක්.

අමාරු වෙලාවක දුන් දුරකථන ඇමතුමක්.
කිසිවකු නොසිටි මොහොතක අප ළඟින් සිටීමක්.
අපට අවශ්‍ය ම වෙලාවේ දිගු කළ අතක්.

අන්තිමේදී මිනිසකුගේ ජීවිතයේ වටිනාකම තීරණය කරන්නේ ඔහු කොපමණ දේවල් එකතු කළා ද යන්නෙන් නොව, ඔහු පිටව යන විට කොපමණ යහපත් මතකයන් අන් අයගේ හදවත් තුළ තබා ගියා ද යන්නෙන් විය හැකි යි.
අපි හැමෝ ම කාගේ හෝ ජීවිතයකට එනවා.
ඒ වගේම දවසක යනවා.
ප්‍රශ්නය "යන්නේ කවදාද?" කියන එක නොවෙයි.
ඒකට පිළිතුර අපි කවුරුත් දන්නේ නැහැ.
වැදගත් ප්‍රශ්නය වෙන එකක්.
"යන දවසට අපි මොනවාද ඉතිරි කරලා යන්නේ?"
තරහක් ද?
තුවාලයක් ද?
අමනාපයක් ද?
නැත්නම් ආදරයක් ද?

අපිට හැමෝගෙ ම ජීවිත වෙනස් කරන්න බැහැ. ලෝකය ම වෙනස් කරන්නත් බැහැ. නමුත් අපේ ජීවිතයට පැමිණෙන කෙනකුගේ දවසක් ටිකක් හොඳ කරන්න පුළුවන්. අඬන කෙනකුට වචනයක් දෙන්න පුළුවන්. වැරදුණු කෙනකුට සමාව දෙන්න පුළුවන්. තනි වූ කෙනකු ළඟ ටික වේලාවක් ඉඳගන්න පුළුවන්. අවශ්‍ය කෙනකුට අත දිගු කරන්න පුළුවන්.

අපේ පැමිණීම අප තීරණය කළේ නැහැ. අපේ පිටවීමත් බොහෝ විට අප තීරණය කරන්නේ නැහැ. නමුත් ඒ දෙක අතර ජීවත් වන ආකාරය ගැන තීරණයක් ගන්න අපට පුළුවන්. ඒ නිසා ජීවිතය සමහර විට අප සිතන තරම් සංකීර්ණ නැහැ.
එනවා.
ටික කලක් ඉන්නවා.
කෙනකුගේ ජීවිතයට යහපතක් කරනවා.
මතකයක් තබනවා.
යනවා.
අවසානයේ ඉතිරි වන්නේ අප ගෙන ගිය දේ නොවෙයි.
අපි තබා ගිය දේ යි.

ශාන්තලාල් හෙට්ටිආරච්චි

උපත සිනාව යි විපත කඳුළ යි

සමනොළ ගිර'ගින්	අඹරෝර
සුනිමල පැහැයෙන්	සිරිසාර
නිර්මල පින් බිම	සිඹ නැර
රන්දුල සිළුමිණ	දිසි මීර
විලසට ගමනක	නිමාවක
වෙහෙසට පත් හිරු	අළාමක
පහසට සිසිලක	සැඳෑවක
සිඳු බට සිළුමිණ	සුයාමෙක
උපතක සුරතල්	සිනාවක
දිවියක ඇරඹුම	කතාවක
විපතක කඳුළැලි	වියෝවක
සොහොනක සැඟවෙන	කලාවක
දෙතොල'ග රැඳවෙන	සිනාවෙක
නයන'ග කඳුළක	විරාමෙක
සියොලඟ සැනහෙන	විනෝදෙක
දිවි අග විඳවන	වියෝගෙක
සිංහල අවුරුදු	කෙළිලෝල
නත්තල සිරිපිරි	මනලෝල
මංගල ලකුණුද	සිඳිලීල
දහවල රැය වෙන	නතුජාල
පුදසුන හිඳුවයි	වෙලාවක
උස'සුන රඳවයි	නිමේෂෙක
සිහසුන ගිලිහෙයි	අරාජික
සැණෙකින ගිල්වයි	අගාධෙක
යසිසුරු ඉතිරෙයි	ගලාගෙන
සුමියුරු මිතුදම්	පුරෝගෙන
තනතුරු සම්පත්	නිවාරණ
වන තුරු පමණයි	සැබෑවන
ඇතිවෙන නැතිවන	මන හාර
හිමිවන ගිලිහෙන	නෙක වාර
එනයන යන එන	හැම වාර
දිවි මිණ දෙවිඳුට	දෙමු බාර
ආවොත් යන්නට	සිදු වේ ය
නාවොත් එන්නට	බැරි වේ ය
එන්නත් යන්නත්	සැලසේ ය
පිපුණත් මල් පර	වන්නේ ය

නාත්තන්ඩියේ, කැතරින් ගුණවර්ධන

ආවා වාගෙ බ යි ගිහේ

පලඳා රන් මුදුව හදා දුන් අම්මා — සුරතට
කැන්දාගෙන ආ හැටි මතක යි ඇය පැල් — කොටයට
රබන් පදය රැව් පිළිරැව් දුනි නැඟුණු — අහසට
උස් උස් උස් උස් වැටකෙයියා උස් වැට — උස්වැට

දස වසරක් පුරා පෙමින් බැඳී සිට — මෙලෙසට
ආවේ උඩු වියන යටින් තුරුලු වෙල යි — මා හට
රතු මල් පොකුරක් අරගෙන සිටින විට දී — සුරතට
මවුපියෝ දෙදෙනා සිටියා අපව බාර — ගන්නට

එදා සිට ම මා සමඟ නැඟ ගෙන පා — පැදියට
නො ගිය තැනක් නැත ආදරයේ සුව — විඳගන්නට
මා නොමැතිව නොමැත ගියේ ඇය කොහෙවත් කිසි — විට
ඇය මා ළඟ මම ඇය ළඟ සිටියෙමු අපි සැම — විට

අසනීප විය ඇයට පසු හතළිස් — වසකට
කළෙමි මම හැමදේමත් කළ යුතු වූ ඇය — හට
නො හැකි ව ඇය සිටින විට දී එළියට බැහැ — ගන්නට
නෑදෑයෝ ආපු තරම බලන්න මතක යි — මට

ගෙවා දිවිය හතළිස් දෙවසක් කිරිපැණි — විලසට
පොරොන්දුව අතින්'ත ගත් දවසේ දුන් — ඉටු කොට
ලද පමණින් පත් වී සැමදා එක ලෙස — සතුටට
මවන ලදී අප නිවස තුළ සුරපුර — මිහිබට

ඔයාට ඇයි අමාරුවක් මා ගැන මේ — තරමට
තාත්තා ද ඔයා මගේ බිහි කෙරුව — මෙලොවට
ඇරලවන්න කීවත් ඇය පුතාලගේ — ගෙදරට
කරන්නට කිසිවක් බැරි නොවුණි — ආදරයට

අවසානේ ගෙන යන විට දී ඇය — නවලෝකෙට
ලේ අඩු වෙනවාට ඇඟේ පරීක්ෂණ — රැසකට
දෙනෙත් පියා ගති මඟ දී උණුහුම මට පුද — කොට
නොහැකි විය දොස්තරවරු හැදුවත් පණ — දෙන්නට

පසු දින රෝහලෙන් පිටව ගොස් මල් — ශාලාවට
ඉටුකර ගෙන පැතුම පැමිණ පුතාලගේ — ගෙදරට
සමු දෙන්නට නැයින් හට දෙදිනක් නැවතී — සිට
පිය නැඟුවේ මනාලියක වාගේ ම ය — සොහොනට

පස්කල් ජයමාන්න - උස්වැටකෙයියාව

සතුට හා කඳුළු

සතුට එනවා
දුක එනවා
දෙක ම ඇවිත්
ආපසු යනවා

සතුට යි දුක යි රිය සක ලෙස කැරකේ
සතුට එන විට දුක පැනලා යන්නේ
දුක ඇති විට සතුට පැනලා යන්නේ
සතුට යි දුක යි නිරතුරු එන්නේ යන්නේ

සතුටේ දෙපසින් හොඳ යි නරක තිබෙනවා
සතුටේ දී පෙනෙනා දේ මායාවක් වී
නැති වෙනවා
දුකේ දී පෙනෙනා දේ ඇත්තක් වී නවතිනවා
ජීවිතයට සතුට යි දුක යි එක සේ ලැබෙනවා

දිමිත්‍රි යොහාන් ප්‍රනාන්දු
ශාඃ ජෝශප් විදුහල,
මරදාන.

පැකුම

උතුරා යන සෙනෙහස
රඳවා නිති අප වෙත
ඔබ ගිය දුර සැම විට
හද පාරයි ඉකිබිඳ

කොපමණ දුක් කරදර
විඳ විඳ අප අතර ම
ඔබ දුන් දිරි දිවියට
කලතයි කඳුළක් නෙත

දෙව් මව් තුරුලට ඔබ
ගිය මඟ හමු වන දින
අයියේ දොඩමළු වන
පැතුමෙන් හිඳිනෙමි මම

ශිරන්ති ප්‍රනාන්දු මෙනවිය
ජයලත් අප ස්වාමිදුගේ බාලිකා විදුහල,
මොරටුව.

කිතුනු අනුගාමිකත්වයේ දිවැසිවර පරිකල්පනය, 15 වන පිටුවෙන් ...

ජේසුස් වහන්සේ අන් අයව බල ගැන්වූයේ ඔවුන්ගේ වේදනාව බෙදා ගනිමින්, ආදරය පතුරවන, ඔවුන් ව ප්‍රකෘතිමත් කරන, සහ ඔවුන්ට යහපත් අනාගතයක් ඇති කරන දෙවියන් වහන්සේගේ ප්‍රේමය අත්දකින්නට සැලැස්වීම සේ ම, දයානුකම්පාව, සුව කිරීම, වැලපීම, කුරුසිපත් සංගතිය, දේවරාජ්‍ය දැක්ම පොහොණි කිරීම වැනි ක්‍රියා වලිනි. උන්වහන්සේගේ ආදර්ශය අනුව යමින් අද කිතුනුවන්ට දිවැසිවර ශක්ති ජනනය සිදු කළ හැකි වන්නේ, බලාපොරොත්තුව පිබිදීම, ජනතාව බල ගැන්වීම, අන් අයගේ ගරුත්වය පොහොණි කිරීම, මැවිල්ල ප්‍රකෘතිමත් කිරීම, සමඟි සම්පන්න ප්‍රජාවන් ගොඩනැඟීම වැනි දේට දායක වීමෙනි.

මෙම සංකලනය සඳහා අත්‍යවශ්‍ය වන සංඝටකයක් වන්නේ තමන්ව ම ත්‍යාජ කරගන්නා වූ, බලහත්කාරයෙන් නොව ආදර්ශයෙන් මෙහෙයවන, සේවය ලැබීම වෙනුවට සේවය කරන, පාලනය කිරීම වෙනුවට බල සම්පන්න කරන කිතුනු අනුගාමිකත්වයකි (kenotic discipleship, පිලිප්පි 2:6-8). කිතුනුවන් දිවැසිවරුන් බවට පත්වන්නේ ජීවිතය නසන දේ හෙළිදරව් කරමින් ජීවිතය ප්‍රකෘතිමත් කරන දේ මුදා හැරීමෙනි. කිතුනු අනුගාමිකත්වය ආලෝකය බවට පත්වන්නේ අඳුර අබියස නිහඬ වීමත්, දුක් කම්කටොළු අබියස ඉච්ඡාභංගත්වයත් ප්‍රතික්ෂේප කිරීමෙනි.

ග්‍රීක බසින් දිවැසිවරයා (ප්‍රොෆෙටෙස් - prophetes) යනු “ඇරියුම් ලත් හෝ කැඳවූ තැනැත්තා” යන්න ය. ඒ නිසා ම දිවැසිවර ක්‍රියාවලිය යනු කිතුනු සැම නොපසුබට ව අත්‍යාවශ්‍යයෙන් ම ඉටු කළ යුතු වූ කාර්ය භාරයකි. ශුද්ධවූ බයිබලයේ හමුවන දිවැසිවරුන් සේ, සමස්ත විශ්වය වෙනුවෙන් දෙවියන් වහන්සේ විසින් සැලසුම් කර ඇති ගැලවීමේ මෙහෙවර (Missio Dei) ඉටු කිරීම සඳහා ලෝකය තුළත් දේව සභාව තුළත් දිවැසිවරයින් වන්නට සැම කිතුනුවකු ම කැඳවා ඇත.

A MOTHER OF EXPECTATIONS



Let me tell you a story.

There was once a mother of two children, one son and one daughter. And with the father, they were a happy family for a little while, then temptations struck the father and so he left his family and went off with another woman. The mother realized that it was useless lamenting for such a man and made the two children, her entire world. She picked herself up all on her own and became strong. She went from house to house working as a maid to earn enough money to fill her children's bellies. She worked all day and night just to send her children to school. Though it was a tough life for her, she was happy because she was doing it all for her children. Her son had a big talent for playing sports especially Cricket, and each time he brought a certificate, medal or trophy home, his mother rejoiced. Her daughter learnt very well and each time she brought her report card of outstanding performance home, her mother became overwhelmed with happiness. However, at school, her son had associated with a bad group of friends and got addicted to drugs during his A/L exams. He became different, his body got sucked in to his bones, he had mental traumas and he couldn't control his emotions. His mother got to know this and tried explaining this to him but, he failed to understand. He lost all his strength to do his sports and greatly disappointed his mother. He got outraged and stole all the money from his mother and ran away from the house. His mother sorrowed greatly as her son brought painful suffering to her and her daughter. His mother had made him her entire life, had a huge dream that her baby boy would one day become a strong man, a skilled Cricketer and bring honor to the country. She had great expectations towards him and her son took it as a burden. She never wanted her son to be successful for her advantage, neither her daughter, she just wanted them to live good lives and be happy. After some hard times, the mother worked constantly and made her daughter a successful doctor. One day, the mother became very ill and was put in bed. After a week, the mother was at her death bed talking to her daughter and she said, "Mother, as it is your last days, it would be only right if we invite ayya to say his goodbye, after all, you are his mother..." So, the daughter wrote a letter to her brother, but he never came. So on her last day, the mother said, "Thank you

daughter, for giving me relief of you living a happy life, it is really all I've ever wanted in my life, and even though your brother disappointed me, I hope that he will find his way and live a good life with God." And the daughter says, "No. Thank you for being a good mother and giving me relief in my childhood, if it wasn't for that, I wouldn't be in this happy life." And so, the mother passed away.

Why do we have to fulfill our mothers' expectations?

If a child cannot fulfill his/her mother's expectations, then who? When we were born to this world, did you think that we were our mothers' dreams, plans or life's goal? No, but she nourished us in her womb, went through nine months of discomfort, welcomed us into the world in her hands and fed us her milk. Why did she do that, because we ultimately became her expectation because there is no other choice? No, because **having your own child is a gift of God and a privilege which not every woman is fortunate enough to have in this world.** Wouldn't we expect our own mother to raise us with love and compassion and did our mothers fulfill our expectation? Of course, they did, because they love us. And don't we love our mothers? So, shouldn't we fulfill their expectations? Yes, not because they fulfilled our expectations at birth but because **having an opportunity to fulfill your mother's expectations is a gift of God and a privilege which not every child is fortunate enough to have in this world.** There may be children in this world without mothers, or children without capabilities to fulfill their mothers' expectations. So, we must accept this gift with open hands just as our mothers did when we were born and thank them for having great expectations in us. Great expectations occur in those who can be trusted to fulfill them and we must be happy and thank God and praise him for giving us our mothers to have expectations in us. Therefore, we should never take our mothers' expectations on us as a burden or as if something annoying. We must try our best to fulfill these expectations as it is our duty. We may have other dreams and goals of our own, and if they favour us positively, I'm pretty sure our mothers will support us in every way. They would never be against our hopes and dreams if they benefit us for our future. Trust in your mother and obey her every word, our mothers would never have bad expectations in us, they would always have good expectations for our betterment, regardless their advantage. They just want us to live good lives and be happy, because they love us. Therefore, let us pray for all the mothers and children around the world that the Lord our God may give them strength and patience to fulfill each other's expectations with love, humility and understanding.

Nimshi Deman
Grade 9,
St. Bridget's Convent,
Colombo-7.

පවුල සරසවියකි



නිමා නොවන ප්‍රේමයේ මං පෙතට දොරගුලු විවර කරවා
දෙවි මැවිල්ලේ උතුම් නිමැවුම ලෙසින් පවුලක් ජනිත කරවා
ලබා දරුසම්පත් වෙලිලා පොළොවේ අයිතිය උරුම කරවා
පැතිර වැඩුමට අසිරි සිරි මැද විශ්වයේ ගම් දනව් පුරවා

ගුණෙන් නැණයෙන් බෙලෙන් සපිරුණ පවුල සරසවියකි ලොවේ
දැනුම අත්දැකුමෙන් මනා ලෙස දෙන පන්නරය සුළු නොවේ
දේව වචනය දිවිය සුරකින බලය බිඳනා සැම පවේ
උගන්වන්නේ දෙමව්පියොමයි තුරුලු කර ගෙන දී සුවේ

එවන් මව්පිය සෙනෙහෙ වෙලිලා සග ලොවට පියවර නඟන්නට
පවුල සුදුසු ම තෝතැන්න වෙයි පෙමෙන් දහමෙන් දිවි ගෙවන්නට
කුරුලු කුඩුවෙ පැටව් සමගින් කුරුලු පවුලක් ලෙස රඟන්නට
සොබා දහමෙන් ගෙනෙන පණිවුඩ හරි අපුරුයි ලොව දිනන්නට

ආදරය අවධානෙ එක ලෙස කලත කලතා හද බැඳින්
දෙමාපිය දූ පුතුන් නිබඳව කොන්දෙසි විරහිත සිතින්
දෙව් දහමෙ පසු බිමට පිවිසී එකට අත්වැල් බැඳ හිඳින්
පවුලෙ මහිමය අලංකාරය අත් දකිමු සුපසන් සිතින්

පවුල් දිවියේ දෙවිඳු අභිමත පසක් කළ සුදු පවුලෙ මහිමය
අපේ දිවියට එකතු කරගමු එයයි ජීවිත දිනන උරුමය
දෙමා පිය දරු සුහද තාවය සදා සුරකින ලෙසට ධර්මය
වැලඳ සුරලොව මඟට පිවිසෙමු මරා ගෙන ජීවිතයෙ කරුමය

පමුණුගම - බෙනී ජයමාන්න

මෙන්න තවත් තෑගියක්...

'භක්ති ප්‍රබොධනය' කලාපයේ සඳහන් වන එක් තේමාවක් ඔස්සේ ඔබගේ අදහස් අපට ලියන්නට ආරාධනා කරමු. මෙවර **"එනවා යනවා" තේමාව යටතේ පළ කර ඇති ගීතය, 'හෙළිදරව්ව' ලිපිය හෝ 'කිතුනු අනුගාමිකත්වයේ දිවැසිවර පරිකල්පනය' යන ලිපිය පිළිබඳ** ඔබගේ අදහස ලියා **'භක්ති ප්‍රබොධනය', අංක 265, ඩීන්ස් පාර, මරදාන, කොළඹ 10** ලිපිනයට තැපැල් කරන්න.

තමන් වටහා ගත් ආකාරයට තමන්ගේ වචනවලින් ලියන්න. වචන 300ට වඩා වැඩි නොවිය යුතු ය. තමන්ගේ ම අත් අකුරින් ලියා එවන්න. **පාසල්, විශ්වවිද්‍යාල මට්ටමේ හෝ උසස් අධ්‍යාපන කටයුතුවල නිරත වන ඕනෑ ම ශිෂ්‍ය ශිෂ්‍යාවකට හෝ විද්‍යාර්ථියකුට** මේ සඳහා ලිපි ඉදිරිපත් කළ හැකි ය. ප්‍රශස්ත මට්ටමේ ලිපි ඉදිරිපත් කරන තිදෙනකුට වටිනා පොත් තුනක් තෑගි වශයෙන් පිරිනැමේ.

පසුගිය කලාපයේ ඉදිරිපත් කළ මෙම තරගයට සහභාගි වූ අතරින් ජයග්‍රහණය කරනුයේ කඳාන නීටා. අයි. ප්‍රනාන්දු සහ මිනුවන්ගොඩ, පැලවත්ත, ඩබ්. උදේශිකා මධුශානි ප්‍රනාන්දු මහත්මියන් ය. ඔබ දෙපලට තෑගි පොත් යථා කාලයේ දී ලැබෙනු ඇත.

යන එන හඬන හිනැහෙන අපි...

යන එන හඬන හිනැහෙන මේ දිවිය තුළ
හෙටට යමක් ඉතුරු කරලා යා යුතු ය
පිපී පර ව යන මල් පමණක් දැක්ක
සුවඳ තබා යනවා මතකයෙ තැද්ද

පැගෙන තණ කොළ පැළයට මල් හිඳුණා
පූංචිම මල වුණත් ලොව ලස්සන කෙරුවා
නො පෙනෙන සුළඟ අපේ ජීවිත රැකගත්තා
කියෙන් කී දෙනා ලොව යුතු කම් රැක්කා

ආමිස්ලෝභ හදෙහි පියවර හිඳිඹා
අමරදේව සලකුණ සිරිලකෙ දුටුවා
ලොවට යහපතක් ඉතිරිව පිය මැක්කා
පැළයක්වත් හිටවන්නට හිත් වීවා


ආවා ගියා එපමණක ද දිවි ගමන
හැරයා යුතුයි ගෙන යා හැකි දෑ තොමැත
තැති තැන අගය, තියෙනා විට තොම අගය
ලුණු මෙත් විය යුතු යි අපගේ දිවියැරිය



චමත් බී. පයාගල
කටුකුරුන්ද, කළුතර

සිතුවම :- එනෝෂ සිල්වා (12 sci) කළුතර සිරිකුරුස විදුහලේ "සම්මානී රූ" චිත්‍ර ප්‍රදර්ශනයෙන්

අමිතගේ හද ගැස්ම .....





එක් සිය හතළිස් අට අබිසෙස් ලැබූ අභිමන්සල අතේ

දිවි දිනන දිරි මං සඳහන
නැණ රැසින් අබිසෙස් ලබන
ඇකයේ හොවා සිප් කිරි පොවන
නැණ පහන් දැල්වූ
දිවිය දැඩි කළ
ආවේ මරියා විදු මවුනි,

පිරුණු ශතකයක් සමඟින්
ගෙවුණු අඩ සියවසක්.....
සෙනෙහසින් තුරුළු කරගෙන අපව
දිරිමත් කළා ඔබ
සතර වේදයෙන් පිරිපුන්
දියණියක නනන්නට
ණය ගැතිය ආවේ මරියා විදු මවුනි
අපි ඔබට....

ශ්වේත වතින් සැරසුණු දෙවොලක
නීල වර්ණ පාසලේ මව් ධජය ලෙළදෙන
ආරුණ සමඟින් ගුවනේ දිස්වෙන
නිති පැසසුම් බුහුමන් ලබන
දියණියන් වූවා අප සැවොම

දසත විහිදුණු
ගුණ නැණෙන් යුතු
දිරිය දියණියන් විලසට
ලොවක් දිනන තුරු
යෝධ පලිහක් ව නිහඬ ව ම ඔබ
බලා සිටියා ය මවක විලසට

පතුරවා ඔබගෙ තේජස නිතියෙන්
තවත් දසවස් සියක්
මිපුරේ ජය කෙහෙලි නඟන්නට
පවුරු වළල්ලක් තනා බැඳෙමු ද අපි
ආවේ මරියා දියණියන් විලසට
මියෙන තුරු මේ මිහිතලය මත

දිගාසිරි වේවා
ආවේ මරියා විදු මවුනි.....

..... එකසිය පනස් විසරක කාලය තුළ
දහස් ගණනක් දුවා දරුවන්ගේ නැණ
නුවණ පහදා දුන්


ආවේ මරියා විදු මවුනි

දෙව් මව් තුරුලේ පහස ලබමින්
යෙහෙන් කිතු ගොස නඟා ඔබේ නම
ලොව බබළවන්නට
දෙවිඳු මහිම ආත්වේවා යි පතන්නෙමි
ආදරණීය දියණියක ලෙසින්.....

ඒ. ඒ. තෙනුමි ලෙහන්සා ආරියප්පෙරුම

12 වසර විද්‍යා අංශය
ආවේ මරියා කන්‍යාරාමය,
මීගමුව.

ප්‍රහේලිකා අංක - 94



පහළට

1. මේ දිනවල පවතින කාලගුණික තත්ත්වය
2. සර්පයා / නාගයා තවත් නමක්
3. ඉතාලියේ අගනුවර
4. ඇස් 3ක් ඇත්තා / ඊශ්වර
7. "රාමායණය" රචනා කරන ලද්දේ
9. ලවය හරයට වඩා විශාල වූ භාග
10. බුද්ධ ධර්මයේ ධර්මය දේශනා කිරීම
11. තාලය
12. දිවෙන් ලබා ගන්නා රස විඳීනය
14. බාහිර රටකට යටත් ව ඇති රටවල්
15. ලෝකයේ විශාලතම සාගරය
18. පාරේ වාහන ගමන් කරන පැත්ත
19. කාර්යයන් පහසු කරගැනීම සඳහා යොදා ගැනේ
21. "ඉඳලා" යන්නට සම අරුත් දේ
25. බීමක් සහ වර්ණයකි
26. වාක්‍යයක් අවසානයේ තබනු ලැබේ
27. වාහනය

හරහට

1. ස්කොට්ලන්තයේ අගනුවර
4. බුද්ධ , ධම්ම, සංඝ යන තුන් සරණ
5. "සිත් පිනවන" යන තේරුම ඇති තනි වචනයක්
6. බුදු දහමෙන් ඉගැන්වෙන පරම විමුක්තිය
8. සවිය සහ බලය ඇති
12. ජීවිතයට හෝ වස්තුවට හෝ වන හානියට වගකීම කල් තබා ගැනීම
13. කේතලයක ජලය පිටවීමට ඇති කොටස
16. ජීව විද්‍යාවට අනුව බිත්තරයකින් බිහි වන පියාපත් නැති කෘමි ජීවන චක්‍රයක මුල් අවස්ථාව ?
17. මරණය
20. චන්ද්‍රයා
22. සංචාරයන්
23. ශරීරයේ කොන්ද පැත්ත
24. නඟුලේ ගෝනුන් බඳින ලීය
26. දරු ප්‍රසූතිය සඳහා භාවිත වන ස්ථානය
28. මේ ලෝකයේ ජීවිතය ආරම්භ වන ස්ථානය
29. ලෝහ තහඩුව

ගරු චාමික සුදර්ශන නි.ම.නි. පියතුමා,
සාන්ත වින්සෙන්ති නිවාසය, මග්ගොන.

ප්‍රහේලිකාව සඳහා ඔබගේ පිළිතුරු තැපැල්පතක පමණක් අලවා පහත ලිපිනයට, **2026 දෙසැම්බර් 15** ට පෙර තැපැල් කරන්න. ජයග්‍රාහකයන් අතුරින් කුසපත් ඇද තෝරා ගත් **තිදෙනකුට මුදලින් තෑගි පිළිවෙළින්, රු.2000.00, රු.1500.00, රු.1000.00** බැගින් පිරිනැමේ. ***විශේෂ මතක් කිරීමක් - ප්‍රහේලිකාවේ විසඳුම් එවන විට ඔබේ නම, පන්තිය, පාසල, පාසලේ සහ නිවසේ ලිපිනය සඳහන් කර එවන්න.***

ප්‍රහේලිකා අංක - 94
"ළමා භක්ති ප්‍රබොධනය", අංක 265, ඩීන්ස් පාර, මරදාන, කොළඹ 10.

ප්‍රහේලිකා අංක 92 - පිළිතුරු

1 ඉ	ගෙ	2 නු	ම්	3 ඉ	4 ගැ	න්	5 වී	ම්	
ති		ග		6 ම	ලු		රා		7 ග
8 හා	9 වා		10 අ		ම		11 ව	ර	ල්
12 ස	ස	ම්	භා	වී		13 බ	ලි		ලෑ
14 ය	ල		ව		15 කා	ල	ය		ල්
		16 ව	ය	ස්	ග	ත		17 එ	ල
18 පි	19 දු	රු			20 ම	ල	21 වී		
22 රි	ද	ව	23 න	වා			24 භා	25 ග	26 ය
27 වෙ	න		ඳු			28 අ	ග	ස්	ති
න		29 ඝි	න්	ල	න්	ත	ය		ය

ආදරණීය දරුවනි,

"ළමා ප්‍රබොධනය" ට
ඔබගේ ලස්සණ නිර්මාණ,
කවි, ගීත, නිසඳැස්,
කෙටිකතා, ලිපි ආදිය ලැබීමට
අපි බොහොම කැමැත්තෙන් සිටිමු.
ඔබ එවන ඒ නිර්මාණය සමඟ
පන්තිභාර ගුරුතුමාගේ හෝ
ගුරුතුමියගේ
අත්සන ඇතිව අප වෙත එවන්න.

සංස්කාරක පියතුමා,
"භක්ති ප්‍රබොධනය",
265, ඩීන්ස් පාර, මරදාන,
කොළඹ 10.
Email: bhakthi.prabodhanaya@gmail.com

ප්‍රහේලිකා අංක 92 ජයග්‍රාහකයෝ

දයාබර දරු දැරියනි,

ප්‍රහේලිකා අංක 92 සම්පූර්ණ කර අප වෙත එවූ සැමට ම ස්තුති කරමු. නිවැරදි පිළිතුරු එවූ දරු දැරියන් අතුරින් පහත නම් සඳහන් දරුවෝ ජයග්‍රහණය කළහ. සහභාගී වූ සියල්ලන්ට ම සුබ පතන අතර ත්‍යාගලාභීන් වෙත ත්‍යාග යථා කාලයේ දී නිවෙස් වෙත ලැබෙන්නට සලස්වන බව කරුණාවෙන් සලකන්න.

නිවැරදි පිළිතුරු එවා ජයග්‍රහණය කළ දරුවෝ

- **පළමු ස්ථානය** - චෙතුලි ජයෝධ්‍යයා, 7 ශ්‍රේණිය, ශ්‍රී. පවුලේ කන්‍යාරාමය කළුතර.
- **දෙවන ස්ථානය** - යොලැන්ඩා වර්ණකුලසූරිය, 6 C ශ්‍රේණිය, ශ්‍රී. පවුලේ කන්‍යාරාමය, කළුතර.
- **තෙවන ස්ථානය** - රුසේලි ප්‍රනාන්දු, 8 ශ්‍රේණිය, ශ්‍රී. පවුලේ කන්‍යාරාමය කළුතර.

භක්ති ප්‍රබෝධනය ඉදිරි තේමා

2027 ජනවාරි / පෙබරවාරි - "කාලය"
(2027 ජනවාරි / පෙබරවාරි කලාපය සඳහා ඔබ එවන ලිපි නොවැම්බර් 15ට පෙර අප වෙත එවන්න.)

2027 මාර්තු / අප්‍රේල් - "දුක් විඳීම , කිතුනු දැක්ම"
(2027 මාර්තු / අප්‍රේල් කලාපය සඳහා ඔබ එවන ලිපි ජනවාරි 15ට පෙර අප වෙත එවන්න.)

කතෝලික ධර්මය
ආදර්ශ ප්‍රශ්න පත්‍රය - I වන කොටස
අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2026

- **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(01) "මා හැර අන් කිසිම දෙවි කෙනෙකු නුඹට නො සිටිය යුතු ය" මේ කීවෙනි පනත ද?

(i) දෙවන පනත (ii) දහවන පනත (iii) තුන්වන පනත (iv) පළමු වන පනත

(02) විශ්වාසයේ ජීවිතයක් ගත කළ පුද්ගලයන් සඳහන් වන පිළිතුර වන්නේ,

(i) මරියතුමිය / ජුදාස් (ii) මරියතුමිය / ආබ්‍රහම් තුමා

(iii) මරියතුමිය / නීරෝ රජු (iv) මරියතුමිය / පාරාවෝ

(03) සෑම අභියෝගයක දී ම දෙවියන් වහන්සේට ප්‍රශංසා කළ තැනැත්තිය කවුරුන් ද?

(i) මාර්තා (ii) ඇග්නස් තුමිය iii) මරිය තුමිය (iv) එළිසබෙත් තුමිය

(04) දිවැසිවරු ප්‍රතික්ෂේප කළ පඬුර වන්නේ කුමක් ද?

(i) සහෝදර ප්‍රේමය හා බද්ධ නොවූ පඬුර (ii) කුළුදුල් බැටළු පැටවා

(iii) අලුත් අස්වැන්න පිදීමේ පඬුර (iv) සතුන් පඬුරු ලෙස ඔප්පු කිරීම

(05) සක්‍රමේන්තු ලබා ගැනීමේ දී පොරොන්දු දෙන සක්‍රමේන්තු ඇතුළත් නිවැරදි පිළිතුර තෝරන්න.

(i) ප්‍රසාද ස්නාපනය / දිව්‍ය සත්ප්‍රසාදය (ii) පූජකවරය / පාපොච්චාරණය

(iii) රෝගීන්ගේ ආලේපය / අභිවෘද්ධි ආලේපය (iv) පූජකවරය / ප්‍රසාද ස්නාපනය

(06) ඉරුදින ශුද්ධ ලෙස ගත කිරීමට අප විසින් කළ යුතු පළමු ණය යුක්තිය කුමක් ද?

(i) ඉරුදින දහම් පාසල් යාම (ii) ඉරුදින දිව්‍ය පූජාවට සහභාගි වීම

(iii) ඉරුදින ලෙඩුන් බැලීමට යාම (iv) ඉරුදින ගෙදර වැඩ කිරීම

(07) දරුවන්ට දෙමාපියන්ට අවවාද කර ලිපියක් ලියන්නේ කවුරුන් ද?

(i) ශු. පාවුලු තුමා (ii) ශු. ක්ලෙමන්ට් තුමා (iii) ශු. අම්බ්‍රෝසි තුමා (iv) ශු. අගුස්තීනු තුමා

(08) "ඔබ අතර යමෙක් ප්‍රධානියා වන්නට කැමැත්තේ නම් ඔහු ඔබේ දාසයා වන්නේ ය"
මෙය කාගේ ඉගැන්වීමක් ද?

(i) මෝසෙස් තුමාගේ (ii) ආබ්‍රහම් තුමාගේ

(iii) ක්‍රිස්තුන් වහන්සේගේ (iv) ජාකොබ් තුමාගේ

(09) "මාගේ පුත්‍රය, පියාගේ අවවාදය අසන්න. මවගේ උපදෙස් ඉවත නොදමන්න".
මෙම වගන්ති සඳහන් පොත නම් කරන්න.

(i) හිතෝපදේශය (ii) විමුක්ති මාර්ගය

(iii) කොලොස්සි (iv) උපදේශකයා

(10) නික්මයාම 20 : 13 ට අනුව පස්වන පනත නම් කරන්න.
(i) ජීවිත විනාශ කරව (ii) මිනී නොමරව
(iii) ජීවිත ආරක්ෂා කරව (iv) මිනී මරව

(11) "නුඹේ සහෝදරයාගේ ලේ පොළොවෙන් මට මොරගසයි". මෙම වාක්‍ය හා සම්බන්ධ සිදුවීම කුමක් ද?
(i) ඊසාක් පූජා කිරීම හා සම්බන්ධ සිද්ධිය (ii) ආබ්‍රහම් හා සම්බන්ධ සිද්ධිය
(iii) කායින් සහ ආබෙල් සිද්ධිය (iv) ආරොන් තෝරා ගැනීමේ සිද්ධිය

(12) "මරණයට පත් වූවත් මම මාගේ දේව ජීවිතය නැති කරගන්නේ නෑ". මෙය පැවසුවේ කා විසින් ද?
(i) ශු. ඇග්නස් තුමිය (ii) ශු. තෙරේසා මව්තුමිය
(iii) ශු. අගතා තුමිය (iv) ශු. මරිය ගොරෙත්ති තුමිය

(13) "යමෙකුගෙන් අයුතු ලෙස යමක් ගෙන තිබේ නම් ඔහුට සතර ගුණයක් ආපසු දෙමි"
මෙසේ පැවසුවේ කවුරුන් ද?
(i) දාවිත් රජතුමා (ii) සක්කේවුස් (iii) කොරනේලියස් (iv) සලමොන් රජතුමා

(14) ජනතා සේවය සඳහා ස්ථාපිත කළ දේව ප්‍රසාද නිධානයකි.
(i) ආශීර්වාදකාර බන්ධනය (ii) රෝගීන්ගේ ආලේපය
(iii) සමගි සන්ධානය (iv) අභිවෘද්ධි ආලේපය

(15) කිතුනු විවාහයේ ලක්ෂණයකි.
(i) ශුද්ධත්වය (ii) කතෝලිකත්වය (iii) අඛණ්ඩත්වය (iv) සාමය

(16) තාපස පැවිදි ජීවිතයට විනය මාලාවක් සකස් කළේ කවුරුන් ද?
(i) ශු. පාවුලු තුමා (ii) ශු. අගොස්තීනු තුමා (iii) ශු. ජෙරොම් තුමා (iv) ශු. බෙනඩික් තුමා

(17) ධර්ම දානය පූජක හා පැවිදි අයගේ පමණක් නොව ගිහියන්ගේ ද දිවැසි කාර්යයකි.
මෙය සඳහන් වන්නේ,
(i) ක.ස.ධ 904 (ii) ක.ස.ධ 605 (iii) ක.ස.ධ 908 (iv) ක.ස.ධ 95

(18) තරුණ කතෝලික ශිෂ්‍ය ව්‍යාපාරයේ ජාත්‍යන්තර මූලස්ථානය පිහිටා ඇත්තේ කොහේ ද?
(i) ඉතාලියේ, රෝමයේ (ii) ප්‍රංශයේ, පැරිස් නුවර
(iii) ප්‍රංශයේ, ලූර්දු නුවර (iv) ඔස්ට්‍රේලියාවේ, මෙල්බන්

(19) ඉතා දිළිඳු අසරණ අයට දයා ප්‍රේමය දක්වන පිණිස ගොඩනංවා ඇති අපෝස්තලික සේවාව කුමක් ද?
(i) දිව්‍ය හෘදයේ සමිතිය (ii) තරුණ කතෝලික ශිෂ්‍ය ව්‍යාපාරය
(iii) සාන්ත විසෙන්ති ද පාවුලා සමිතිය (iv) මරිය හමුදාව

(20) මැවීම පිළිබඳ දෙවන කථා පුවතට අනුව දෙවියන් වහන්සේ මිනිසාට පැවරූ වගකීම් දෙකකින් එකක් වන්නේ,

(i) පාලනය කිරීම
(ii) විනාශ කිරීම
(iii) බෙදා හැරීම
(iv) වගා කිරීම

පිළිතුරු

(01) iv	(02) ii	(03) iii	(04) i
(05) iv	(06) ii	(07) i	(08) iii
(09) i	(10) ii	(11) iii	(12) iv
(13) ii	(14) i	(15) iii	(16) iv
(17) i	(18) ii	(19) iii	(20) iv

ජේ. ඒ. එල්. එම්. ශ්‍රීමති සිල්වා මෙනවිය.
විදුහල්පතිනිය - මිනු / පහළ මඩම්පැල්ල කනිෂ්ඨ විද්‍යාලය - කටාන.

අ.පොස. (උ.පෙළ) ක්‍රිස්තියානි ධර්මය/ශිෂ්ටාචාරය සඳහා අත්වැලක්

පලස්තීනයේ භූගෝලීය පසුබිම III

පසුගිය කලාපයේ පලස්තීනයේ භූගෝලීය කලාප බෙදීම සම්බන්ධව සාකච්ඡා කර ඇත. මෙම ලිපියෙන් බලාපොරොත්තු වන්නේ ඒ ඒ කලාපවලට අයත් ප්‍රධාන භූගෝලීය ප්‍රදේශයන් දැනුවත් කිරීම කෙරෙහි ය. ක්‍රිස්තුන් වහන්සේ උපත ලැබූ ක්‍රි. පූ. 6 - 4 අතර කාලය වන විට පලස්තීනය රෝම අධිරාජයා ගේ අණසකට ලක් වී තිබුණු යුගයකි. පලස්තීනයේ රෝම පාලනය ආරම්භය ලෙස අඩිතාලම වැටෙන්නේ ක්‍රි. පූ. 63 දී පොම්පේ සෙනවියා පලස්තීනය ආක්‍රමණය කිරීමත් සමඟය. එහෙත් ක්‍රි. පූ. 37 පමණ වන විට රෝම අධිරාජයා වූයේ අගෝස්තුස් සීසර් ය. ඉන් පසුව පලස්තීනය රෝම අධිරාජයාගේ යටත් විජිතයක් විය. එම යටත් විජිතයේ ක්‍රිස්තුස් වහන්සේ ජීවත් වූ සමයේ ධර්මදූත කටයුතු කළ භූගෝලීය ප්‍රදේශ පහත සඳහන් පරිදි සාකච්ඡා කළ හැකි ය.

පලස්තීනයේ රෝම පාලනය

ක්‍රි. පූ. 37 දී ඉදුමියා ජාතිකයෙකු වූ මහා හෙරොද් පලස්තීනයේ ආණ්ඩුකරු ලෙස පත් විය. එතැන් සිට ක්‍රි. පූ. 4 දක්වා ඔහු ගේ පාලන සමය වේ. මහා හෙරොද් ගේ මරණයෙන් පසුව පලස්තීනය ප්‍රදේශ 3කට බෙදා ගෙන ඔහුගේ පුතුන් තිදෙනා පාලනය කළහ. ඒ අනුව,

1. වැඩිමහල් පුතු ආණ්ඩුකාර හෙරොද් අර්කෙලාවුස් ක්‍රි. පූ. 4 සිට ක්‍රි. ව. 6 දක්වා ජුදයාව, සමාරිය, ඉදුමියාව ඔහුගේ පාලනයට යටත් විය.
2. ආණ්ඩුකාර හෙරොද් ඇන්ටිපස් ක්‍රි. පූ. 4 සිට ක්‍රි. ව. 39 දක්වා ගලීලය හා පෙරයාව ඔහුගේ පාලනයට යටත් විය.
3. ආණ්ඩුකාර දෙවන හෙරොද් පිලිප් ක්‍රි. පූ. 4 සිට ක්‍රි. ව. 34 දක්වා පිලිප්පි කයිසාරිය ප්‍රදේශය ඔහුගේ පාලනයට යටත් විය.

එම ආණ්ඩුකාරවරුන් ගේ පාලනය යටතේ වූ ප්‍රදේශ අතර ප්‍රධාන නගර කිහිපයකි.

ගලීලය

ක්‍රිස්තුස් වහන්සේ තම ප්‍රසිද්ධ ජීවිතයේ දී බොහෝ කටයුතු සිදු කර ඇත්තේ එම ප්‍රදේශයේ දී ය. ගලීලය ප්‍රසිද්ධත්වයට පත්වන්නේ ගලීල මුහුදු එම භූමියේ පිහිටා ඇති බැවිනි. ගලීල මුහුදට භාවිත වන තවත් නම් කිහිපයකි. එනම් තිබේරියස් විල, ජෙනසෙරෙත් විල, කින්නරෙත් විල. ගලීලයේ ප්‍රධාන නගර වන්නේ නාසරත්, කානා, නායින්, කපර්නාවුම, මද්ගලාව, තිබේරියස්, බෙත්සයිදා, තාබොර් කන්ද එ ප්‍රදේශ ඇතුළත් ය. කාර්මේල් කඳුවැටිය, තාබොර් කන්ද, ඒබාල් කන්ද යන කඳු 3 යා කරමින් එස්ත්‍රලෝන් තැනිතලාව පිහිටා ඇත. එම තැනිතලාව හේතුවෙන් ගලීලය කොටස් දෙකකට වෙන් වේ. එනම් ඉහළ ගලීලය සහ පහළ ගලීලය ලෙසය.

සමාරිය

ක්‍රි. පු. 722 අසිරියානු අධිරාජයා ගේ ආක්‍රමණයට පෙර එම ප්‍රදේශය හැඳින්වූයේ ෂෙකම් යන නාමයෙනි. ක්‍රි. පු. 922 දී පලස්තීනය දෙකඩ වී රාජ්‍යයන් දෙකක් බවට පත් විය. එනම් උතුරු රාජ්‍යය හෙවත් ඉශ්රායලය. එහි අගනුවර වූයේ ෂෙකෙම් නගරය යි. එම ප්‍රදේශයේ බහු දේව වන්දනාවට ප්‍රසිද්ධ දේවාල පිහිටා තිබුණි. බාල් දේව වන්දනාව ඉතා ප්‍රසිද්ධ ය. එම හේතුවෙන් සහ ඔවුන් සංකර ජාතියක් ලෙස සැලකූ බැවින් ජුදාවරු ඔවුන් සමඟ ගනු දෙනුවක් නොවුණා පමණක් නොව එම ප්‍රදේශයට ද නො ගියහ. ආබ්‍රහම් තුමා කානාන් දේශයට පැමිණි පසුව එම ස්ථානයේ නතර වී පූජාසනයක් ඉදි කළ බව උත්පත්ති 12/ 6-7 හි සඳහන් වේ. ඉශ්රායෙල්වරු නික්මයාම ගමන ආරම්භ කිරීමේ දී මිසරයේ භූමදානය කළ ජෝසප් ගේ ඇටකටු රැගෙන විත් තැන්පත් කළේ ද සමාරියේ ය. (ජොෂුවා 24/ 32) ජාකොබ් තුමා කනින ලද ළිඳ පිහිටා ඇත්තේ ද සමාරියේ ය.

ජුදයාව

ක්‍රි. පු. 922 පලස්තීන රාජ්‍යය දෙකඩ වීමෙන් පසුව බිහි වූ අනෙක් කොටස එහි දකුණු රාජ්‍යය යි. එනම් ජුදයාව යි. එහි අගනුවර වූයේ ජෙරුසලෙම් නගරය යි. එය ඒක දේව වන්දනාවට ප්‍රසිද්ධත්වය, ඉසිලූ එක ම දේව මාළිගාව වූ ජෙරුසලෙම් දේව මාළිගාව එහි පිහිටා ඇත. හෙබ්‍රොනය, ඔලිව් කන්ද, බෙත්ලෙහෙම, ජෙරිකෝව, බෙතානිය ප්‍රධාන නගර අතර වේ. මුහුදු මට්ටමේ සිට ඉතා උස් ප්‍රදේශයක් වූ එම ප්‍රදේශයේ බෙත්ලෙහෙම් නගරයෙ දී ක්‍රිස්තු උපත සිදු වී ඇත. ආබ්‍රහම් සහ සාරයි යන දෙදෙනා භූමදානය කළ මක්පේලාව හි ගුහාව ද පිහිටා ඇත්තේ එහි ය. බෙතානිය ක්‍රිස්තුස් වහන්සේ ගේ මිතුරකු වූ ලාසරස් පදිංචි ව සිටි ස්ථානය යි. ක්‍රිස්තුස් වහන්සේ බෞතිස්මය ලැබූ ජෙරිකෝව පිහිටා ඇත්තේ ජෝර්දාන් ගඟ මළ මුහුදට වැටෙන ආසන්නයේ ය. ජුදයාව පලස්තීනයේ තෙවන විශාල ප්‍රදේශය වේ.

නැඟෙනහිර කඳු

එම ප්‍රදේශයේ බොහෝ දුරට කාන්තාර ප්‍රදේශයකි. බෂාන්, ගිලියද්, ආමෝන්, මෝවබ්, එදොම් ප්‍රධාන නගර වේ. බශාන් ප්‍රදේශයේ ජීවත් වූයේ මනස්සේගේ වංශයට අයත් ජනතාව ය. මෝවබ් ගිලියද් ප්‍රදේශ රූබන්ගේ හා ගාද්ගේ වංශයට අයත් ජනතාව ජීවත් වූ ප්‍රදේශයන් ය. යාර්මුක්, ජාබොක්, ආර්නෝන්, සෙරද් යන කුඩා ගංගා නැඟෙනහිර කඳු පෙළ සිට ගලාගෙන පැමිණ ජෝර්දාන් ගඟට එක් වේ. නැඟෙනහිර කඳුකරයට ඔබ්බෙන් සිරියානු කාන්තාරය පිහිටා ඇත. නික්මයාම ගමන අවසානයේ මෝසෙස් තුමා සහ ආරොන් තුමන් මිය ගොස් ඇත්තේ ද මෝවබ් ප්‍රදේශයේ දී ය. එතැන් පටන් දේව ජනතාවට නායකත්වය සපයා ඇත්තේ ජොෂුවා තුමා ය. ජොෂුවා මෝවබ් සිට ජෙරිකෝව හරහා පැමිණ පොරොන්දු දේශය අත්පත් කර ගෙන ඇත.

සටහන : **ශාස්ත්‍රපති එස්. හේමාල් පෙරේරා**

Best Wishes

AQUINAS
COLLEGE OF HIGHER STUDIES
"Be Competent and Build Character"
ESTD 1954

ACHS

විශිෂ්ට වෘත්තියකට දොරටුව විවර කරමු!

රජයේ අනුමත සරසවියකින් ඔබේ උපාධි සිහිනය සැබෑ කරගන්න

- BACHELOR OF ARTS (GENERAL)
- BACHELOR OF INFORMATION TECHNOLOGY (BIT)
- BSC (HONS) IN AGRO INDUSTRY MANAGEMENT
- BSC IN PSYCHOLOGY AND COUNSELLING
- B.ED (HONOURS) IN ENGLISH
- BA IN RELIGIOUS STUDIES

APPROVED BY

අධ්‍යාපන අමාත්‍යාංශය
MINISTRY OF EDUCATION

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
UNIVERSITY GRANTS COMMISSION

උසස් පෙළ ප්‍රතිඵලය අනුව සම්පූර්ණ පාඨමාලා ගාස්තුව සඳහා ශිෂ්‍යත්ව අවස්ථා


- අන්තර්ජාතික පිළිගැනීම සහිත උපාධි පාඨමාලාවන්
- සහනදායී පොලී රහිත ගෙවීමේ පහසුකම්
- ආරක්ෂිත නේවාසික පහසුකම්
- රැකියාවේ නියැළෙන අතර උපාධි පාඨමාලාව හැදෑරීම සඳහා පහසුකම



වැඩිදුර තොරතුරු සඳහා අමතන්න
077 156 4090

0117 389 115 | www.aquinas.lk | No. 30, Gnanartha Pradeepa Mawatha, Maradana Road, Colombo 08.

Hayleys Solar



මිල රු.100/=
(සහන මිල)

"භක්ති ප්‍රබොධනය" සංස්කාරක ගරු එමාඩ් දල්පතාදු නි.ම.නි. පියතුමන් විසින් කොළඹ 10 එස් ඇන්ඩ් එස් ප්‍රින්ටර්ස් මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී. පුවත් පතක් ලෙස තැපැල් හලේ ලියාපදිංචි කර ඇත. DOP/MAGAZINE/03/2026